# ශ්‍රී ලංකාවේ
# ටීවී රේඩියෝ ලයිසන් කථාව

විකාශන බලපත්‍ර ලබාදීමේ නීතිමය ප්‍රතිපාදන සහ
ප්‍රායෝගික භාවිතාව පිළිබඳ විමසුමක්

2020 අප්‍රේල්


සම්පාදනය

**නීතිඥ ජගත් ලියන ආරච්චි**



MEDIA LAW FORUM

**මාධ්‍ය නීති සංසදය**

**පෙළගැස්ම**


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම - ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය හා ටෙලිවිෂනය | 03 |
| 2. | ගුවන් විදුලි විකාශන පවත්වාගෙන යාම සදහා බලපත්‍ර ලබාගැනීම | 05 |
| 3. | ටෙලිවිෂන් විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | 09 |
| 4. | ගුවන් විදුලි තරංග භාවිතය සඳහා බලපත්‍ර ලබාදීම | 14 |
| 5. | විකාශන අන්තර්ගතයන් නියාමය සඳහා ගෙන ඇති පියවර | 16 |
| 6. | විකාශන බලපත්‍ර හා අන්තර්ගතයන් නියාමය සඳහා වූ සම්මත නොවූ පනත් කෙටුම්පත් | 21 |
| 7. | නිරීක්ෂණ නිගමන හා නිර්දේශ (සමාප්තිය) | 26 |
| 8. | ඇමුණුම් | 29 |
| I. | ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව | 30 |
| II. | රූපවාහිනී සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව | 31 |
| III. | විදුලි සංදේශ පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව | 33 |
| 9. | මූලාශ්‍ර | 36 |

# 1. හැඳින්වීම
# ශ්‍රී ලංකාවේ ගුවන් විදුලිය හා ටෙලිවිෂනය

## 1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා ටෙලිවිෂන් විකාශනය සඳහා රජය මෙන්ම පුද්ගලික අංශය ද මැදිහත්වී ඇත. විකාශන නාලිකා ගණන දෙස බැලූ විට රාජ්‍ය අංශය අභිබවා පුද්ගලික අංශය ගුවන් විදුලි හා ටෙලිවිෂන් විකාශන ක්‍ෂෙත්‍රයේ අධිපතීත්වය දරන බව පැහැදිලි වේ. රජයට අයත් ගුවන් විදුලි හා ටෙලිවිෂන් විකාශන ආයතන අදාල පනත් මගින් ස්ථාපනය කර ඇති අතර පුද්ගලික නාලිකා සඳහා විකාශන බලපත්‍ර ලබාගත යුතුය. මෙම බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සිදුවන්නේ කෙසේද? එම බලපත්‍රවල සඳහාන් වන කරුණු මොනවාද? හා විකාශනයන්හි අන්තර්ගතය නියාමනය වන්නේ කෙසේද? යන්න පිළිබඳව ගුවන් විදුලි හා ටෙලිවිෂන් වැඩසටහන් අසන දකින සාමාන්‍ය ජනතාවට පමණක් නොව ජනමාධ්‍ය සමාජයට ද අවබෝධයක් නැත.

එබැවින් විකාශන බලපත්‍ර ලබාදීමේ නීතිමය ප්‍රතිපාදන මෙන්ම ප්‍රායෝගික භාවිතාව කුමක්ද යන්න මෙන්ම මෙම බලපත්‍රවල සදහන් අන්තර්ගතයන් මොනවාද? යන්න පිළිබඳව අධ්‍යනයක් කිරීම මගින් එම තොරතුරු සමාජයට ලබාදීම හා ඒ මගින් එකී ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම සඳහා සමාජ අවධානයට යොමු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සිදුවන්නේ විවෘතව නොවේ. ජනතාව දකින්නේ නාලිකාවන් මගින් විකාශනය වන වැඩසටහන් මිස විකාශන බලපත්‍ර හෝ ඒවායේ සඳහාන් කොන්දේසි හෝ අන්තර්ගතයන් නොවේ. විකාශන බලපත්‍ර විවෘත ලේඛන නොවන බැවින් සාමාන්‍ය ක්‍රමවේදයන් භාවිතා කරමින් මෙම බලපත්‍ර ලබාගත නොහැක. එබැවින් මෙම අධ්‍යයනය සඳහා අවශ්‍යවන විකාශන බලපත්‍ර පිටපත් හා අනෙකුත් ආයතනික ක්‍රමවේදයන් පිළිබඳව තොරතුරු ලබාගත්තේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ ප්‍රතිපාදන භාවිතා කරමින් යොමුකරන ලද තොරතුරු ඉල්ලීම් මගිනි.

## 1.2. ගුවන් විදුලිය

ශ්‍රී ලංකාවේ මුල්ම ගුවන් විදුලි විකාශනය සිදුකළ දිනය පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් වී තිබුණ ද නිළ වශයෙන් ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි විකාශනය ආරම්භ වූ දිනය ලෙස සලකණු ලබන්නේ 1925 දෙසැම්බර් 16 වනදාය[1] එය සිදුවූයේ මධ්‍යම විදුලි සංදේශ කාර්යාලය තුල පිහිටුවන ලද විකාශන මැදිරියක් තුළය.

නමුත් 1923 වසරේදී ලංකා වයර්ලස් සමාජය නැමති සංවිධානය විසින් ගුවන්විදුලි විකාශනයක් ආරම්භ කිරීම සඳහා රජයෙන් බලපත්‍රයක් ඉල්ලා සිටින ලදී.මෙම ඉල්ලීමට ප්‍රතිචාර ලෙස තැපැල්පතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කළ අතර ඔවුන් පහත කරුණු පිළිබඳව පරීක්‍ෂා කළහ.

(අ) ලංකාවේ ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු ආම්භ කළ යුතුද යන වග

(ආ) එසේ නම් එය ආරම්භ කළ යුත්තේ රජය මගින්ද? නැතහොත් පෞද්ගලිකවද?

(ඇ) පෞද්ගලිකව නම් බලපත්‍ර නිකුත් කළ යුත්තේ එක් සමාගමකටද? නැතහොත් සමාගම් කිහිපයකටද?

(ඈ) ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පාලනය කිරීමට මණ්ඩලයක් පත් කළ යුතුද? එසේ නම් එය තෝරාගන්නේ කෙසේද?

මෙම කමිටුවේ මතය වූයේ ගුවන් විදුලි ප්‍රචාරය පුද්ගලික සමාගමකට නොදිය යුතු බවත් එය තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ කළ යුතු බවත්ය[2]

ක්‍රමයෙන් වර්ධනය වූ ලංකා ගුවන් විදුලි සේවාවේ සංධිස්ථානයක් සනිටුහන් කරන්නේ 1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත සම්මතවීමත් සමඟය.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ගුවන් විදුලි විකාශනයන් සිදු කිරීම ගුවන් විදුලි සංස්ථාවට පමණක් සීමා වූ අතර වෙනත් ඕනෑම තැනැත්තෙකු ගුවන් විදුලි විකාශනයක් සිදුකරන්නේ නම් ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු විය.[3]

---

[1] පිටුව 203 _ ජනසංනිවේදන ඉතිහාසය _ රාජා කටුගම්පල
[2] පිටුව 7 ගුවන් විදුලි වංශයඩී.එම්.කොළඹගේ
[3] 44 වන වගන්තිය 1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත

පුද්ගලික ගුවන් විදුලි විකාශනයක් සඳහා බලපත්‍ර ලබාදීම පිළිබඳ ප්‍රතිපාදන 1966 දී ඇතුළත් කර තිබුණ ද 1980 අග භාගය වනතෙක් ම ගුවන් විදුලි විකාශනය සඳහා පුද්ගලික ආයතන වෙත බලපත්‍ර ලබාදී නොතිබිණි. ශ්‍රී ලංකාව තුළ මේ වන විට රාජ්‍ය සතු ගුවන් විදුලි සේවා ආයතන දෙකක් ක්‍රියාත්මක වන අතර, පෞද්ගලික ගුවන්විදුලි විකාශන ආයතන විසිහයක් ද ගුවන් විදුලි විකාශන බලපත්‍ර ලබා ඇත.

## 1.3. ටෙලිවිෂනය

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ටෙලිවිෂන් විකාශනයක් ආරම්භ කරන්නේ 1979 අප්‍රේල් මස 13 වන දින ස්වාධීන රූපවාහිනී සේවය මගිනි. එය පුද්ගලික ටෙලිවිෂන් විකාශනයකි. පසුව 1979 ජූනි 5 වන දින හා අංක 39/04 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම ටෙලිවිෂන් සේවාව රජයට පවරාගනු ලැබීය.[4]

මේ අනුව ගුවන් විදුලිය මෙන් නොව ටෙලිවිෂන් විකාශනයේදී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛස්ථානය ගන්නේ රජය නොව පුද්ගලික අංශයයි. එය ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන විකාශනයක් නොවූ අතර එහි වැඩසටහන් දැකබලා ගැනීමට හැකියේ කොළඹ අවට ප්‍රේක්ෂකයන්ට පමණකි.

පසුව 1982 අංක 6 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සම්මත කිරීමත් සමග ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භ විය. පනත අනුව ටෙලිවිෂන් විකාශනය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට පමණක් සීමාවූ අතර පුද්ගලික අංශය විසින් ටෙලිවිෂන් විකාශනයන් සිදුකරන්නේ නම් විෂය භාර අමාත්‍යවරයාගෙන් ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය.

ශ්‍රී ලංකාව තුල මේවන විට රජය සතු ටෙලිවිෂන් සේවා 2ක් ද පෞද්ගලික අංශය සතු ටෙලිවිෂන් සේවා 54 ක් ද බලපත්‍ර ලබා ඇත.

[4] https://sri-lanka.mom-rsf.org/si/%E0%B6%B8%E0%B6%B0%E0%B6%BA/detail/outlet/independent-television-network-itn/

# 2. ගුවන් විදුලි විකාශන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාගැනීම

ආරම්භයේදී ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි විකාශනය රාජ්‍ය අංශය සතු කාර්යයක් බවට පත්ව තිබූ බව ඉහත පරිච්ඡේදයේ විස්තර කරන ලදී. 1923 වසරේදී පුද්ගලික අංශය ඒ සඳහා අවසර ඉල්ලා සිටිය ද එය නොලැබුන බවද එහිදි සඳහාන් කරන ලදී. ලංකාවේ ගුවන් විදුලිය මුල්කාලයේ පවත්වාගෙන යන ලද්දේ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ අංශයක් ලෙසය. පසුව ගුවන් විදුලි දෙපාර්තමේන්තුව බවට පත්විය. සඳහා වෙනම පනතක් සම්මත වීමත් සමගම එය වඩාත් විධිමත් ආයතනයක් බවට පත් විය.

## 2.1. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත

1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි සංස්ථා පනත 1966 නොවැම්බර් මාසයේදී සම්මත කරන ලදී. මෙම පනතේ ප්‍රධානම අරමුණ වූයේ ලංකා ගුවන් විදුලි සංස්ථාව පිහිටුවීමයි. පසුව මෙම පනත 1974 අංක 5 දරණ සංශෝධන පනත. 1977 අංක 11 දරණ සංශෝධන පනත 1988 අංක 48 දරණ සංශෝධන පනත හා 1996 අංක 8 දරණ සංශෝධන පනත් මගින් සංශෝධනය වී ඇත.

1974 අංක 5 දරණ සංශෝධනය මගින් ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ වසර දෙකකට වඩා සේවය කර ගුවන් විදුලි සංස්ථාවට සම්බන්ධ වූ සේවයකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකන බවට ප්‍රතිපාදන ඇතුලත් විය. 1977 අංක 11 දරණ සංශෝධන පනත මගින් මෙතෙක් ලංකා ගුවන් විදුලි සංස්ථාව යන නාමය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස සංශෝධනය කරන ලදී. 1988 අංක 48 දරණ පනත මගින් ගුවන් විදුලි සංස්ථාවේ විෂය පථය තවත් පුලුල් කිරීමක් සිදුකල අතර ග්‍රාහක යන්ත්‍ර සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයද හදුන්වා දෙන ලදී,

1996 අංක 8 දරණ විශේෂ විධිවිධාන පනත මගින් ගුවන් විදුලි දෙපාර්ථමේන්තුවේ සිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවයට පැමිණි සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකන බවට ප්‍රතිපාදන ඇතුලත් කරන ලදී,

## 2.2. ගුවන් විදුලි විකාශන බලපත්‍ර ලබාදීම

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 44 වන වගන්තියට අනුව පෞද්ගලික විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයාට බලපත්‍ර ලබාදිය හැකි බව දක්වයි. එම පනතේ 44(2) වගන්තියට අනුව එසේ බලපත්‍රය නිකුත් කිරීමට පෙර ගුවන් විදුලි සංස්ථාව විසින් ගැසට් පත්‍රයේ හෝ පුවත්පත්වල පළකිරීමෙන් පුද්ගලික ගුවන් විදුලි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අයදුම්පත්‍ර කැදවිය යුතුය. එම අයදුම්පත්‍ර පිළිබඳව විභාග කිරීමෙන් අනතුරුව සුදුසු අයදුම්කරුවන් සඳහා විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කළ හැකිය.

පනතේ 44(4) වගන්තියට අනුව එම පුද්ගලික විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අදාලව පහත සඳහාන් කරුණු පිළිබඳව අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය යුතුය.

- පුද්ගලික විකාශණ බලපත්‍ර අයදුම්පත් විභාග කරන ක්‍රමවේදය
- පුද්ගලික විකාශන මධ්‍යස්ථාන විසින් විකාශණය කරනු ලබන වැඩසටහන් අධීක්ෂණය පාලනය කිරීම
- අයදුම්පත්‍ර ඉදිරිපත් කරන තැනැත්තන් විසින් හෙළිදරව් කළ යුතු කරුණු
- විකාශණ මධ්‍යස්ථානවල හිමිකාරීත්වය දැරීම තහනම් වන පුද්ගල කණ්ඩායම් පිළිබඳව
- පුද්ගලික විකාශන මධ්‍යස්ථාවල හිමිකාරීත්වය හුවමාරු කිරීම පාලනය කිරීම පිළිබඳව
- අයදුම්පත්‍ර ආකෘතිය සම්බන්ධව
- විකාශන බලපත්‍ර ගාස්තු සම්බන්ධව

මෙම නීතිමය ප්‍රතිපාදන අනුව අදාල නියෝග අමාත්‍යවරයා විසින් නිකුත් කර තිබේද, යන්න හා ඒවා ක්‍රියාත්මක වන්නේද, යන්න පිළිබඳව සලකා බැලිය යුතුවේ.

## 2.3. පුද්ගලික ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා නිකුත් කර ඇති විකාශන බලපත්‍ර

ජනමාධ්‍ය අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලුම්පත්‍රයකට අනුව මේ වන තෙක් නිකුත් කර ඇති සියලුම විකාශන බලපත්‍රවල පිටපත් පරීක්ෂා කිරීමේදී මේවන විට විකාශන බලපත්‍ර 25 නිකුත් කර ඇත.

**බලපත්‍ර ලබාදීම් කාල වකවානු අනුව(රජයන් අනුව)**

| | කාල පරිච්ඡේදය | බලපත්‍ර ප්‍රමාණය |
|---|---|---|
| 1 | 1978-.1994 ජුනි | 3 |
| 2 | 1994 ජුලි . -2001 ඔක්තෝබර් | 1 |
| 3 | 2001 නොවැම්බර් . -2004 පෙබරවාරි | 3 |
| 4 | 2004 මාර්තු- .2010 අප්‍රේල් | 15 |
| 5 | 2010 මැයි -. 2015 ජනවාරි | 1 |
| 6 | 2015 ජනවාරි -. 2019 ජුනි | 2 |

**අවලංගු කර ඇති විකාශන බලපත්‍ර**

ජනමාධ්‍ය අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියට අනුව පහත සඳහාන් ආයතන වෙත ලබාදී තිබූ ගුවන් විදුලි විකාශන බලපත්‍ර අමාත්‍යංශය විසින් අවලංගු කර තිබේ.

1. කුඩා තේවතු සංවර්ධන අධිකාරිය- අවලංගු කළ දිනය-2007-2-21
2. තාරුණ්‍යයට හෙටක් - අවලංගු කළ දිනය-2008-5-23
3. එල්ටීටීඊ සාම ලේකම් කාර්යාලය- අවලංගු කළ දිනය-2009-1-7
4. සැටි නෙට් පුද්ගලික සමාගම- අවලංගු කළ දිනය-2017-4-6

මෙම අවලංගු කිරීමට හේතු හෝ අවලංගු කිරීමේ ක්‍රමවේදයන් පැහැදිලි කර නැත[5]

**ගුවන් විදුලි විකාශණ ආරම්භකර නොමැති ආයතන**

ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් විකාශණ බලපත්‍ර නිකුත් කළ ද, ගුවන් විදුලි විකාශනයන් මෙතෙක් ආරම්භ කර නොමැති බලපත්‍රලාභි ආයතන තුනක් ඇත. එනම්

- Global Radio Broadcasting Company
- Ritz Asia
- J Lanka Group of Company

මේ අතරින් Ritz Asia ආයතනයට විකාශනයන් ආරම්භ කිරීමට නොහැකිවී ඇත්තේ ගුවන් විදුලි තරංග වෙන් කරගැනීමට නොහැකි වීම නිසාය. එම ආයතනයට බලපත්‍රය ලබාදී ඇත්තේ 2011 වසරේ වන අතර එය වසර පහක කාලයක් සඳහා ලබාදුන් බලපත්‍රයකි. එබැවින් එම බලපත්‍රය නැවත අලුත් කිරීමක් සිදු නොකළහොත් අහෝසි වී යයි.[6] අනෙක් ආයතන දෙක විකාශන ආරම්භ නොකිරීමට හේතුව පැහැදිලි නැත.

## 2.4. බලපත්‍ර කොන්දේසි

නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසිවල ඒකමිතියක් දක්නට නොලැබේ. නමුත් පොදුවේ ගත්විට බොහෝ විකාශන බලපත්‍රවල දක්නට ලැබෙන පොදු කොන්දේසි වනුයේ

- අමාත්‍යංශය විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් අයකළ හැකි බව
- අමාත්‍යවවරයාට නව කොන්දේසි පැනවිය හැකි බව
- බලපත්‍ර ලබාදුන් විකාශන මධ්‍යස්ථානයට අතිරේකව විකාශන මධ්‍යස්ථාන පිහිටුවන්නේ නම් ඒ සඳහා අවසර ලබාගත යුතු බව
- විකාශනය කරනු ලබන වැඩසටහන් දින 60ක් දක්වා ඩීවීඩී මගින් ආරක්ෂා කර ගත යුතු බව
- දේශීය ප්‍රවෘත්ති විකාශනයන් සඳහා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජෙනරාල් වරයාගෙන් අවසර ලබාගත යුතු බව

[5] https://media.gov.lk/images/pdf_word/2019/radio_application_0712.pdf
[6] https://media.gov.lk/images/pdf_word/2019/radio_application_0712.pdf

### බලපත්‍රවල වලංගු කාලය

නිකුත් කර තිබූ බලපත්‍ර 25 අතරින් බලපත්‍ර 24 කම සඳහාන් වූයේ ඒවා තාවකාලික බලපත්‍ර බවත් ස්ථිර බලපත්‍රයක් නිකුත් කරන තෙක් වලංගුව පවතින බවත්ය. එක් බලපත්‍රයක( Ritz Asia) පමණක් වලංගු කාලය වසර 5ක් ලෙස දක්වා ඇත.

### විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම, ප්‍රමිතීන් හා පරිචයන් පිලිපැදීම සඳහා වන කොන්දේසිය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් සම්පාදනය කල විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම හා ප්‍රමිතීන් හා පරිචයන් අනුගමනය කල යුතු බවට බලපත්‍ර 12ක සඳහාන් වන අතර. අමාත්‍යංශය විසින් සම්පාදනය කරන ලද ගුවන් විදුලි විකාශන ආචාර ධර්ම, ප්‍රමිතීන් හා පරිචයන් පිළිපැදිය යුතු බවට වූ කොන්දේසිය බලපත්‍ර 11ක සඳහාන් වේ. එකී බලපත්‍රවල ඇමුණුමක් ලෙස එම ආචාර ධර්ම වල පිටපතක් ලබාදී ඇත.එක් බලපත්‍රයක සඳහාන් වන්නේ විකාශණ ආචාර ධර්ම කඩ කිරීම විකාශන බලපත්‍රය අවලංගු කිරීමට හේතු වන බවයි. තවත් එක් බලපත්‍රයක එවැනි කොන්දේසියක් ඇතුළත් ව නැත. (ආචාර ධර්ම පිළිබඳව විස්තරයක් පස්වන පරිච්ඡේදයේ ඇතුලත් වේ.)

### අධ්‍යක්‍ෂක මණ්ඩල සඳහා දේශපාලන සබදතා තහනම්

බලපත්‍ර 11කම සදහන් වූයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස හෝ අධ්‍යක්‍ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පලාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතන නියෝජිතකයකු ඇතුළත් නොවිය යුතු බවයි.

### දේශීය ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම පිළිබඳව කොන්දේසිය

විදේශීය ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් බලපත්‍රවල ඇතුලත් කර නොමැත නමුත් Power House PVT LTD සඳහා ලබාදී ඇති විකාශන බලපත්‍රයේ විකාශනය කරන වැඩසටහන් අධ්‍යාපනය,සංගීතය,ක්‍රීඩා සහ පවුලේ විනෝදාත්මක වැඩසටහන් සඳහා පමණක් සීමා කර ඇත.

MGM Networks ආයතනය වෙත නිකුත් කර ඇති ගුවන් විදුලි විකාශන බලපත්‍රයේ ප්‍රවෘත්ති විකාශනය පිළිබඳ කිසිදු සඳහනක් නොමැත.

අනෙක් විකාශන බලපත්‍ර සියල්ලේම සඳහාන් වන්නේ දේශීය ප්‍රවෘත්ති විකාශනය කරන්නේ නම් ඒ සඳහා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂක ජෙනරාල්වරයාගෙන් අනුමැතිය ලබාගත යුතු බවයි.

දේශීය ප්‍රවෘත්ති විකාශනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ වන ප්‍රතිපාදන භාවිතා කරමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරී වෙතින් සිදුකරන ලද තොරතුරු විමසීමේදී දැනගැනීමට ලැබුනේ කිසිදු ගුවන් විදුලි විකාශන ආයතනයක් වෙත ප්‍රවෘත්ති විකාශනය සඳහා බලපත්‍ර ලබාදීමක් මෙතෙක් සිදුකර නොමැති බවයි.[7]

1994 ඔක්තෝබර් 14 වන දින වර්ෂයේදී පොදු පෙරමුණු රජයේ මාධය ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලය වෙත ප්‍රවාත්ති, සංචාරක සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ධර්මසිරි සේනානායක මහතා විසින් ඉදිරිපත් කල අතර එහි "අදහස් පලකිරීමේ අයිතිය" යටතේ III වන අංකය ලෙස දක්වා ඇත්තේ

"සියලුම විද්‍යුත් මාධ්‍යවලට ප්‍රවෘත්ති එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ අයිතිය ලබා දෙනු ඇත. ප්‍රවෘත්තිවල සමතුලිත ආවරණයක් ඉදිරිපත් කරන ලෙස අපි රජය සතු සහ පෞද්ගලික විද්‍යුත් මාධ්‍යවලින් ඉල්ලා සිටිමු. සියලුම විද්‍යුත් මාධ්‍යවල ප්‍රවෘත්ති වැඩසටහන්වල පිළිගත හැකි පරාමිතීන් සැකසෙන ප්‍රඥ්ඥප්තියක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීම සඳහා රජය මාධ්‍ය සහ මාධ්‍යවේදීන්ගේ සංගම් වෙත සිය සහයෝගය ලබා දෙනු ඇත." යනුවෙනි.

නමුත් 1994 වසරෙන් පසුව නිකුත් කල විකාශන බලපත්‍රයන් හිදි දේශිය ප්‍රවෘත්ති සම්බන්ධව වූ ඉහතකි කොන්දේසිය ඇතුලත් වේ.

### වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ කොන්දේසිය

ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත අදාල විකාශන බලපත්‍ර හිමි ආයතනවල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ කොන්දේසිය බලපත්‍ර 3ක සඳහාන් වන අතර අනෙක් බලපත්‍රවලට එවැනි කොන්දේසියක් ඇතුළත් කර නොමැත.

[7] RTI Application No-DGI/DI/RTI/2019/02

**ගාස්තු අයකිරීම**

එක් බලපත්‍රයක හැර සෑම බලපත්‍රයකම බලපත්‍ර ගාස්තුවක් පිළිබඳව සඳහාන් වේ. “අමාත්‍යංශය විසින් තීරණය කරනු ලබන බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතුය” යනුවෙන් සදහනක් සමහර බලපත්‍රවල තිබෙන අතර, සමහර බලපත්‍රවල එම ගාස්තුව නොගෙවීම බලපත්‍රය අවලංගු කිරීමට හේතුවක් ලෙසද දක්වා ඇත. නමුත් බලපත්‍ර ගාස්තුව කුමක්ද යන්න හෝ බලපත්‍ර ගාස්තුව ගනණය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව සඳහනක් නොමැත.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ජනමාධ්‍ය අමාත්‍යංශය වෙතින් මේ පිළිබඳව විමසීම් සිදුකල අතර ඒ සඳහා ප්‍රතිචාර ලෙස ජනමාධ්‍ය අමාත්‍යංශය දන්වා තිබුනේ එවැනි බලපත්‍ර ගාස්තුවක් තීරණය කර නොමැති බව හා බලපත්‍ර ගාස්තු අය කිරීමක් සිදුවී නොමැති බවය.

**බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 44(2) වගන්තියට අනුව පුද්ගලික විකාශන ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ හෝ පුවත්පත්වල දැන්වීමක් පළකළ යුතුය. එසේම 44(4) වගන්තියට අනුව අදාල ක්‍රමවේදය විස්තර කරමින් අදාල නියෝග ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. නමුත් එවැනි නියෝග පැනවීමක් හෝ පුවත්පත් දැන්වීම් සිදු කර නොමැත. ජනමාධ්‍ය අමාත්‍යංශයේ වෙබ් අඩවියේ ගුවන් විදුලි විකාශන බලපත්‍ර ඉල්ලුම් කිරීමේ බලපත්‍ර ආකෘතියක් පළ කර ඇති අතර එම ඉල්ලුම්පත්‍රය මගින් විකාශන බලපත්‍රයක් ඉල්ලුම් කළ හැකිය[8]. කෙසේ නමුත් විකාශන බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සම්පුර්ණයෙන්ම විනිවිදභාවයෙන් තොරව පවතී.

[8] https://media.gov.lk/images/pdf_word/2020/radio_application_2020.pdf

# 3. ටෙලිවිෂන් විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම

### 3.1. රූපවාහිනී සංස්ථා පනත

ශ්‍රී ලංකාව තුළ ටෙලිවිෂන් විකාශනයන් මුල්වරට ආරම්භ කරන්නේ පුද්ගලික අංශය විසිනි, පසුව එය රජයට පවරා ගන්නා ලදී, ටෙලිවිෂන් විකාශනයන් පිළිබඳව විධිමත් නීතිමය පසුබිමක් සැකසෙන්නේ 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත සම්මත වීමත් සමගය, මෙම පනත මේ වන විට 1988 අංක 43 දරණ සංශෝධන පනත මගින් සංශෝධනයට ලක්ව ඇත. රූපවාහිනී ග්‍රාහක යන්ත්‍ර සඳහා බලපත්‍ර ලබාදීම සහ රූපවාහිනී යන්ත්‍ර එකලස් කිරීම ආනයනය ආදී කටයුතු සඳහා බලපත්‍ර ලබාගැනීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුලත් කිරීම මෙම සංශෝධනය මගින් සිදුවී ඇත. පනතේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීමය. ශ්‍රී ලංකාව මුලුල්ලේ රූපවාහිනී විකාශනයන් පවත්වාගෙන යාම හා එයට අදාල අනෙකුත් කටුයුතු සිදු කිරීම සඳහා පනත මගින් රූපවාහිනී සංස්ථාවට බලය පවරා ඇත.

### 3.2. ටෙලිවිෂන් විකාශන බලපත්‍ර ලබාදීම

රූපවාහිනී සංස්ථා පනතේ 28(1) වගන්තිය දක්වන්නේ රූපවාහිනී සංස්ථාව හැර වෙනත් කිසිදු තැනැත්තෙකු රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා අමාත්‍යවරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවයි.

එසේම පනතේ 28(2) වගන්තියෙන් දක්වන්නේ අමාත්‍යවරයාට රූපවාහිනී සංස්ථාව විමසා පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි බවයි.

පනතේ 28(3) වගන්තිය දක්වන්නේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තෙකුට පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා යුක්තිසහගතව අවශ්‍ය විය හැකි කාර්මික,මුදල් හා වෘත්තීය සුදුසුකම් ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් මිස අමාත්‍යවරයා විසින් කිසිම බලපත්‍රයක් නිකුත් නොකරනු ලැබිය යුතු බවයි.

නමුත් මෙම වගන්තියේ සඳහාන් ආකාරයක් අමාත්‍යවරයා වෙත ලැබෙන විකාශන බලපත්‍ර ඉල්ලුම්පත්‍ර ඇගයීමේ හෝ විශ්ලේෂණය කිරීමේ හෝ ඒ සඳහා අදාල වන නිර්ණායක පවතින බවට කිසිම තොරතුරක් නොමැත.

### 3.3. පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග-2010

2008 ඔක්තෝබර් 10 දින අංක1570/35 දරණ ගැසට් පත්‍රය මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් රූපවාහිනී සංස්ථා පනතේ 31 වන වගන්තිය යටතේ පැවරුන බලතල අනුව "පුද්ගලික විකාශන මධ්‍යස්ථාන නියෝග" පනවන ලදී . නමුත් එම නියෝග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව පවසමින් පුරුවැසියන් විසින් මූලික අයිතිවාසිකම් නඩුවක් පවරණ ලදී[9]. එම නඩුවට අදාලව අධිකරණයෙන් පිටතදී එම නියෝග අවලංගු කිරීමට ජනමාධ්‍ය අමාත්‍යංශය එකඟවන ලදී[10].

එකී එකඟතාවය අනුව 2010 සැප්තැම්බර් මස 3 වන දිනය හා අංක 1669/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඉහත නියෝග අවලංගු කරන ලදී.

ඒ අනුව ඉහත ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද "2010 පුද්ලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග" මගින් පුද්ගලික ටෙලිවිෂන් විකාශන මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර ලබාදීම හා පවත්වාගෙන යාම සම්බන්ධව සැලකිය යුතු වෙනසක් ඇති විය.

ඒ අනුව රූපවාහිනී සංස්ථා පනත යටතේ නිකුත් කරනු ලබන පුද්ගලික විකාශන මධ්‍යස්ථාන පදනම් තුනක් යටතේ වර්ග කර ඇත. එනම්

(අ)- රූපවාහිනී නරඹන්නන් වෙත ප්‍රවේශ වීම සඳහා භාවිතා කරනු ලබන තාක්ෂණය අනුව-

- ඇනලොග්
- ඩිජිටල් වශයෙන්ද

[9] SCFR No. 478/2008- Centre for Policy Alternatives and Dr.PaikiasothySaravanamuttu vs. Anura PriyadarshanaYapa and Hon. Attorney General

[10] පිටුව 103 ශ්‍රී ලංකාවේ මාධය ප්‍රතිපත්තිය සහ නීතිය Media reform lanka- පළමු මුද්‍රණය 2012

(ආ)- නරඹන්නන් අනුව

- විකාශනය නැරඹීම සඳහා යම් කාල සීමාවකට දායක මුදලක් ගෙවීම
- විකාශනය නැරඹීම සඳහා යම් කාල සීමාවකට දායක මුදලක් නොගෙවීම වශයෙන්ද

(ඇ)- විකාශන ප්‍රේක්ෂණය කිරීමට භාවිතා කරන්නා වූ යටිතල පහසුකම් අනුව

- බලපත්‍රලාභියාට අයත්
- වෙනත් බලපත්‍රලාභියෙකුට අයත්  යනුවෙන් වර්ගීකරණයන් පවතී

මෙම රෙගුලාසි වලට අනුව ජනමාධ්‍ය අමාත්‍යංශය වෙතින් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේදී රුපියල් ලක්‍ෂයක නැවත නොගෙවන ගාස්තුවක් ද සමග ඉල්ලුම්කල යුතු බව දක්වා තිබේ.

### 3.4. දැනට නිකුත් කර ඇති ටෙලිවිෂන් විකාශන බලපත්‍ර

**නිකුත් කර ඇති ටෙලිවිෂන් විකාශන බලපත්‍ර වර්ගය අනුව**

| | **බලපත්‍ර වර්ගය** | **බලපත්‍ර ප්‍රමාණය** |
|---|---|---|
| 1 | IPTV<br>අන්තර්ජාලය මත පදනම් වූ විකාශන | 2 |
| 2 | MOBILE TV<br>ජංගම දුරකථ මත පදනම් වූ විකාශන | 1 |
| 3 | SATELLITE TV<br>චන්ද්‍රිකා මත පදනම් වූ විකාශන | 8 |
| 4 | CABLE TV<br>කේබල් මත පදනම් වූ විකාශන | 10 |
| 5 | TERRESTRIAL TV<br>භෞමීය රූපවාහිනී විකාශන | 33 |

මෙම වර්ගිකරණ පදනම්ව ඇත්තේ දැනට අවලංගු කර ඇති 2007 පෞද්ගලික ටෙලිවිෂන් විකාශන මධ්‍යස්ථාන නියෝග යන්හි දක්වා ඇති වර්ගීකරණයන්ට අනුවය

**නිකුත් කර ඇති ටෙලිවිෂන් විකාශන බලපත්‍ර කාලය අනුව (රජයන් අනුව)**

| **කාල පරිච්ඡේදය** | | Terrestrial TV | Satellite TV | Cable TV | IPTV | Mobile TV |
|---|---|---|---|---|---|---|
| 1 | 1978-1993 | 3 | - | - | - | - |
| 2 | 1993-2001 | 2 | 1 | 3 | - | - |
| 3 | 2001-2004 | 5 | - | - | - | - |
| 4 | 2004-2010 | 13 | 2 | 3 | 1 | 1 |
| 5 | 2010-2014 | 6 | 1 | 3 | 1 | - |
| 6 | 2015-2019 | 4 | - | 1 | - | - |
| | **එකතුව** | **33** | **6** | **10** | **2** | **1** |

මෙම සටහනට අනුව ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් රූපවාහිනී විකාශනය සඳහා ආයතන 52 ක් වෙත විකාශන බලපත්‍ර නිකුත් කර ඇති බව පැහැදිලිය.

අමාත්‍යංශයේ මූලාශ්‍රවලට අනුව මේ වන විටත් පහත සදහන් බලපත්‍රලාභී ආයතන මෙතෙක් විකාශන ආරම්භ කර නොමැත.

1. Lanka Television Network(pvt) Ltd
2. Lakview Broadcasting (pvt)Ltd
3. Dialog Television Network(pvt)Ltd
4. Lanka Broadcasting Network(pvt0Ltd
5. Yellow Win Medial (Pvt)
6. Globaal Television Broadcasting Ltd
7. Future sat Holding (pvt)
8. Ritz Asia (pvt)

එසේම තොරතුරු පනත භාවිතා කරමින් ලබාගත් බලපත්‍ර පිටපත්වල ඇති සටහන් අනුව පහත ආයතන විසින්ද විකාශන කටයුතු ආරම්භ කර නොමැත.

9. Southern Development Authoraty of Sri Lanka( Cable TV)
10. Television and Radio Network ( Cable TV)
11. Grant Commission (Pvt) Ltd (Cable TV)

### 3.5. විකාශන බලපත්‍රවල අන්තර්ගයන් හා කොන්දේසි

විකාශන බලපත්‍රයන් හි ආකෘතිය හා අන්තර්ගතය දෙස බලන විට ඒ වායේ කිසිදු ඒකමිතියක් දක්නට නොලැබේ. විකාශන බලපත්‍ර පිළිබඳව සිදුකරන ලද පරීක්ෂා කිරීමේදී අන්තර්ගතයන් හා කොන්දේසි පිළිබඳව පහත පරිදී පොදු ලක්ෂණ දක්නට ලැබිණි.

#### බලපත්‍ර වලංගු කාලය

ටෙලිවිෂන් විකාශන බලපත්‍ර 52 න් 42 කම සඳහාන් වන්නේ එම බලපත්‍ර තාවකාලික බලපත්‍ර බවත් ස්ථිර බලපත්‍රයක් නිකුත් කරන තෙක් වලංගු බවත්ය. Dialog Television ආයතනයට 2004 වසරේදී නිකුත් කල තාවකාලික බලපත්‍රය අවලංගු කරමින් 2012 වසරේදී නව බලපත්‍රයක් නිකුත් කර ඇත. Rangiri Dambulla Development Foundation. Lanka Cable & Satelite Network (pvt)Ltd ( Cable TV), Dialog Televison(pvt) Ltd (IPTV) ආයතනයන්ට නිකුත් කර ඇති බලපත්‍රයේ සදහන් වන්නේ වාර්ෂිකව බලපත්‍රය අලුත්කිරීමේ කොන්දේසිය මත වසර පහක කාලයක් සඳහා ලබාදෙන බවත් වසර පහ අවසානයේදී කාර්ය සාධනය සලකා බලා කාලය දීර්ග කරන බවත්ය.

- Carlton Sport Network
- Dialog Television(pvt)Ltd ( Cable TV)
- Ask Cable Vision Private Limited ( Cable TV)
- Dish TV (pvt) Ltd (Setellite TV)
- Sri Lanka Telecom(IPTV)
- Mobitel (pvt) Ltd- (Mobile TV)

ආයතනයන්ට නිකුත් කර ඇති බලපත්‍රයේ වලංගු කාලය පිළිබඳව කිසිදු සදහනක් නැත.

#### පොදු කොන්දේසි

බලපත්‍රවල සඳහාන් කොන්දේසි එකිනෙකට වෙනස් වුවද පොදුවේ අති බහුතරයක් බලපත්‍රවල සඳහාන් වූ කොන්දේසි කිහිපයක් ද හඳුනාගත හැකිය. එනම්

- විකාශනයන් රූපවාහිනී සංස්ථාව පිළිගත් ආචාර ධර්ම පද්ධතියකට අනුව විකාශනය කළ යුතු බව
- අමාත්‍යවරයාට අතිරේක කොන්දේසි විටින් විට එකතු කළ හැකි බව
- විකාශනය කරනු ලබන වැඩසටහන් වල ඩීවීඩී දින 60ක් දක්වා තබාගත යුතු බව
- බලපත්‍රය හිමි සමාගමේ ලිපියනය හා හිමිකරුවන් වෙනස් වන්නේ නම් ඒ පිළිබඳව ජනමාධ්‍ය අමාත්‍යංශය දැනුවත් කල යුතු බව
- අමාත්‍යංශය විසින් තීරණය කරනු ලබන බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු බව

**බලපත්‍ර ගාස්තුව**

සෑම බලපත්‍රයක ම පාහේ (බලපත්‍ර 10ක හැර) බලපත්‍ර ගාස්තුවක් ගැන සඳහන් වුව ද එම බලපත්‍ර ගාස්තුව කොපමණ මුදලක් ද යන්න හා එය ගණනය කරන්නේ කෙසේද යන්න සඳහාන්ව නැත. ජනමාධ්‍ය අමාත්‍යංශය වෙතින් කරන ලද තොරතුරු විමසීමකදී දැනගැනීමට ලැබුනේ 2010-09-03 දින අංක 1669/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව ආපසු නොගෙවන ඉල්ලුම්පත්‍ර ගාස්තු ලෙස රුපියල් ලක්ෂයක මුදල ලබාගැනීම හැර එවැනි බලපත්‍ර ගාස්තු අයකිරීමක් මෙතෙක් සිදුවී නැති බවයි.

**රූපවාහිනී ආචාර ධර්ම පිළිබඳ කොන්දේසි**

විකාශන බලපත්‍ර 47 ක බලපත්‍ර කොන්දේසියක් ලෙස සඳහාන් වන්නේ සියලුම වැඩසටහන් ජාතික රූපවාහිනී සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආචාර ධර්ම හා පරිචයන්ට අනුකූල ලෙස පවත්වාගෙන යා යුතු බවයි. තවත් බලපත්‍ර තුනක සඳහන් වන්නේ ඇමතිවරයා විසින් පනවන ආචාර ධර්ම හා පරිචයන් අනුව කටයුතු කල යුතු බවයි.

එක් විකාශන බලපත්‍රයක සඳහන් වූයේ වෙළඳ දැන්වීම් ප්‍රචාරණයේදී රූපවාහිනී සංස්ථාව මගින් පිළිගන්නා ලද ආචාරධර්ම හා පරිචයන් ට අනුකූල විය යුතු බවයි.

තවත් බලපත්‍රයක සඳහාන් වූයේ යම් වැඩසටහනක් මගින් විකාශණ ආචාර ධර්ම කඩ කිරීම බලපත්‍රය අවලංගු කිරීමේ හේතුවක් වන බවයි. නමුත් එම ආචාර ධර්ම මොනවාද යන්න සඳහාන් කර නොතිබිණි.

විකාශන ආචාර ධර්ම හා පරිචයන් පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහක් පස්වන පරිච්ඡේදයේ සදහන් වේ.

**වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ කොන්දේසිය**

විකාශන බලපත්‍රලාභී ආයතන විසින් වාර්ෂිකව විගනනය කරන ලද ගිණුම් ප්‍රකාශයන් වාර්ෂිකව ඉදිරිපත් කල යුතු බවට කොන්දේසියක් විකාශන බලපත්‍ර 33 ක ඇතුළත් වූ අතර මෙම කොන්දේසිය බලපත්‍ර 19 ක ඇතුළත් නොවීය.

**අධ්‍යක්ෂක මණ්ඩල සඳහා දේශපාලන සබදතා තහනම් කිරීමේ කොන්දේසිය**

බලපත්‍ර 35 ක ම සඳහාන් වූයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස හෝ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පලාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතන නියෝජිතකයකු ඇතුළත් නොවිය යුතු බවයි. මෙම කොන්දේසිය බලපත්‍ර 17 ක ඇතුළත් නොවීය.

**දේශීය ප්‍රවෘත්ති විකාශනය සම්බන්ධ කොන්දේසි**

ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති රූපවාහිනී විකාශන බලපත්‍ර 52 අතරින් පහත සඳහාන් ආයතන වෙත නිකුත් කර ඇති විකාශන බලපත්‍රවල සඳහාන් වන්නේ දේශීය ප්‍රවෘත්ති විකාශනය කරන්නේ නම් ඒ සඳහා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක ජෙනරාල්වරයාගෙන් අනුමැතිය ලබාගත යුතු බවයි.

I. East West Information Systems -Extra Terrestrial Vision(pvt) Ltd EAP Network(pvt)
II. I.W.S.Holding Company Ltd
III. Television & Radio Network
IV. Ru-Ras Lanka pvt ltd
V. ASSET Media pvt LTD
VI. Power House PVT LTD
VII. Television and Radio Network ( Cable TV)
VIII. Grant Commission (pvt) Ltd ( Cable TV)
IX. Southern Development Authority ( Cable TV)
X. Messrs Dynavision Broadcasting Co.(pte)Ltd
XI. Dish TV (pvt) Ltd

එසේම පහත සඳහාන් ආයතන දෙක සඳහා ලබාදී ඇති විකාශන බලපත්‍රවල විකාශනය කරන වැඩසටහන් අධ්‍යාපනය,සංගීතය,ක්‍රීඩා සහ පවුලේ විනෝදාත්මක වැඩසටහන් සඳහා පමණක් සීමා කර ඇත.

I. Teleshan Network pvt Ltd

II. Lanka Television Network

අනෙක් බලපත්‍ර 39 ක දේශීය ප්‍රවෘත්ති විකාශනයන් ගැන කිසිදු සඳහනක් නැත.

දේශීය ප්‍රවෘත්ති විකාශනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ වන ප්‍රතිපාදන භාවිත කරමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තොරතුරු නිලධාරී වෙතින් සිදුකරන ලද තොරතුරු විමසීමේදී දැනගැනීමට ලැබුනේ කිසිදු රූපවාහිනී ආයතනයක් වෙත දේශීය ප්‍රවෘත්ති විකාශනය සඳහා බලපත්‍ර ලබාදීමක් මෙතෙක් සිදුකර නොමැති බවයි[11].

1994 ඔක්තෝබර් 14 වන දින වර්ෂයේදී පොදු පෙරමුණු රජයේ මාධය ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලය වෙත ප්‍රවාත්ති, සංචාරක සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ධර්මසිරි සේනානායක මහතා විසින් ඉදිරිපත් කල අතර එහි “අදහස් පලකිරීමේ අයිතිය” යටතේ III වන අංකය ලෙස දක්වා ඇත්තේ

“සියලුම විද්‍යුත් මාධ්‍යවලට ප්‍රවෘත්ති එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ අයිතිය ලබා දෙනු ඇත. ප්‍රවෘත්තිවල සමතුලිත ආවරණයක් ඉදිරිපත් කරන ලෙස අපි රජය සතු සහ පෞද්ගලික විද්‍යුත් මාධ්‍යවලින් ඉල්ලා සිටිමු. සියළුම විද්‍යුත් මාධ්‍යවල ප්‍රවෘත්ති වැඩසටහන්වල පිළිගත හැකි පරාමිතීන් සැකසෙන ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීම සඳහා රජය මාධ්‍ය සහ මාධ්‍යවේදීන්ගේ සංගම් වෙත සිය සහයෝගය ලබා දෙනු ඇත.” යනුවෙනි.

නමුත් 1994 වසරෙන් පසුව නිකුත් කල විකාශන බලපත්‍රයන් හිදි දේශිය ප්‍රවෘත්ති සම්බන්ධව වූ ඉහතකි කොන්දේසිය ඇතුලත් වේ.

[11] RTI Application No-DGI/DI/RTI/2019/02

# 4. ගුවන් විදුලි තරංග භාවිතය සඳහා බලපත්‍ර ලබාදීම

### 4.1. විකාශනය සඳහා ගුවන්විදුලි තරංග

රූපවාහිනී හා ගුවන් විදුලි භූමිගත විකාශනයන් සිදුකරනු ලබන්නේ ගුවන් විදුලි තරංග උපයෝගී කරගෙනය. මේ සඳහා විකාශනයට අදාල තරංග වෙන්කර ගැනීමක් සිදුකල යුතුය. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි තරංග භාවිතය සඳහා අවසර දීම සම්බන්ධයෙන් ඒකාධිකාරය පවතින්නේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙතය. එබැවින් ගුවන් විදුලි හෝ ටෙලිවිෂන් විකාශන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යවරයාගෙන්(හෝ අදාල විෂය භාර අමාත්‍යවරයාගෙන්) බලපත්‍රයක් ලබාගත්තද, විකාශනයන් සිදුකිරීම සඳහා අවශ්‍ය ගුවන් විදුලි තරංග වෙන් කර ගැනීම හා ඒ සඳහා අවසර ලබාගැනීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙතින් සිදුකළ යුතුය.

### 4.2. විදුලි සංදේශ පනත

ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි තරංග වෙන් කිරීම පිළිබඳව නීතිමය විධිමත්භාවයක් යම් තාක් දුරට ඇතිවන්නේ 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත සම්මත වීමත් සමගය. මෙම පනත 1996 අංක 27 දරණ සංශෝධන පනත මගින් සංශෝධනය විය.ඒ අනුව එකී සංශෝධන පනත මගින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බිහිකරන ලදී. එමෙන්ම මුල් පනතේ ප්‍රතිපාදන සෑහෙන දුරට සංශෝධනය කරන ලදී. ගුවන් විදුලි තරංග භාවිතාව පිළිබඳ පූර්ණ වශයෙන් නියාමන බලය සහිත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිහිටුවීම එහි සංයුතිය බලතල හා වගකීම් පිළිබඳවද, ගුවන් විදුලි තරංග භාවිතය සඳහා බලපත්‍ර ලබාදීම පිළිබඳවද නීතිමය ප්‍රතිපාදන මෙම පනතේ ඇතුළත් වී ඇත,

### 4.3. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය

1996 අංක 27 දරණ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරණ විදුලි සංදේශ නියාමන පනතේ 22 වන වගන්තිය මගින් ගුවන් විදුලි තරංග සඳහා බලපත්‍ර ලබාදීමට අදාල නීතිමය ප්‍රතිපාදන දක්වා තිබේ,

පනතේ 22 වන වගන්තිය අනුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගත් බලපත්‍රයක් නොමැතිව කිසිදු පුද්ගලයකු ශ්‍රී ලංකාවේ භූමිය තුළ හෝ දේශීය ජල තීරය තුළ ගුවන් විදුලි තරංග භාවිතකරමින් විකාශනයන් නොකළ යුතුය. එසේ බලපත්‍රයක් නොමැතිව ගුවන් විදුලි තරංග භාවිතා කරමින් විකාශනයන් සිදුකිරීම වරදක් වන අතර පනතේ 44 වගන්තියට අනුව එවැනි වරදක් සිදුකරන පුද්ගලයකුට රුපියල් 20000--- ත් 100000 අතර දඩයක් හෝ මාස 6ක් දක්වා සිර දඬුවම් හෝ එම දඬුවම් දෙකම ලබාදිය හැකිය.

ඒ අනුව පුද්ගලික අංශය මෙන්ම රාජ්‍ය අංශය ද ගුවන් විදුලි තරංග භාවිතා කරමින් විකාශනයක් සිදුකරන්නේ නම් ඒ සඳහා කොමිෂන් සභාව වෙතින් බලපත්‍රයක් ලබාගත යුතුය. මෙම බලපත්‍ර ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇත. නමුත් පනතේ 22(2) වගන්තිය දක්වන්නේ

- අ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝජිත ආයතන
- ආ. පොලිසිය සන්නද්ධ හමුදා සහා ජාතික ආරක්‍ෂාවට අදාල ආයතන
- ඇ. විදේශීය දූත මණ්ඩල
- ඈ. කලින් කලට බලය පවරන ජාත්‍යන්තර නියෝජිත ආයතන හා සංවිධාන සඳහා තරංග බලපත්‍ර ලබාදීමේදී ඒ සඳහා ගාස්තු අය නොකල යුතු බවයි.

ගුවන් විදුලි තරංග භාවිත කරමින් විකාශනයන් සිදුකිරීම අපේක්‍ෂා කරන අයදුම් කරුවන් ඒ සඳහා වන ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත සිදුකල යුතුය. එකී අයදුම්පත්‍රය සලකා බලා කොමිෂන් සභාවට බලපත්‍රයක් නිකුත් කල හැකිය. එසේ බලපත්‍රයක් නිකුත් කිරීමේදී බලපත්‍රය සඳහා අදාල වන කොන්දේසි ඇතුලත් කල හැකිය. එසේ ඇතුලත් කරනු ලබන කොන්දේසි කඩ කිරීම බලපත්‍රය අහෝසි කිරීමට හේතුවක් වේ. එසේම කොමිසම විසින් යම් ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විටක එම තීරණයට එරෙහිව මාසයක් ඇතුලත අභියාචනාධිකරණය වෙත අභියාචනා කල හැකිය.


MEDIA LAW FORUM

### 4.4. 1996 අංක 2 දරණ විදුලි සංදේශ (ගුවන් විදුලි තරංග බලපත්‍ර)නියෝග

1996 ජුනි 25 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මගින් පලකරන ලද මෙම නියෝග මගින් ගුවන් විදුලි තරංග බලපත්‍ර ලබාදීම යම් විධිමත්භාවයක් ඇති කිරීමට උත්සාහ කර තිබේ. මෙම නියෝග මගින් බලපත්‍ර අයදුම් කිරීම සඳහා අයදුම්පත් ආකෘතියක් මෙන්ම විකාශන බලපත්‍රයේ (වාර්ෂික) ආකෘතියද හදුන්වා දී ඇත. එසේම බලපත්‍ර ගාස්තු උපලේඛනය ද වාර්ෂිකව බලපත්‍ර අලුත්කිරීමේ ගාස්තු උපලේඛණය ද හඳුන්වාදී ඇත.

### 4.5. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ගුවන්විදුලි හා රූපවාහිණී විකාශන බලපත්‍ර[12]

| බලපත්‍ර වර්ගය | බලපත්‍රලාභී ආයතන ගණන |
|---|---|
| FM Sound Broadcasting | 20 |
| Short wave | 1 |
| Medium Wave | 1 |
| UHF / VHF / TV Broadcasting | 17 |
| Direct-to-Home Satellite Broadcasting Service | 5 |
| Cable TV Distribution Network Operators | 3 |

### 4.6. බලපත්‍රයන් හි කොන්දේසි

සෑම බලපත්‍රයක්ම 1996 නියෝගයන්ට අනුකූලව සකස් කර ඇති අතර එහි සඳහාන් වන කොන්දේසියක් වන්නේ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය මඟින් ඉදිරිපත් කර ඇති ගුවන් විදුලි නියෝගයන්ට හා බලපත්‍රය සමග අමුනා ඇති කොන්දේසි සහ සීමාකිරීම්වලට යටත්ව එම බලපත්‍රය නිකුත් කරනු ලබන බවයි.

බලපත්‍රය සමග අමුණා ඇති කොන්දේසි හා සීමා කිරීම් 25ක් සඳහාන් වන අතර මෙම කොන්දේසි හා සීමා කිරීම් සියල්ලම තාක්ෂණික කොන්දේසි හා සීමා කිරීම්ය. එකී කොන්දේසි අතර,

- විකාශන ක්‍රියාවලිය අවසරයකින් තොරව වෙනත් ස්ථානයක සිදු කිරීමෙන් වැලකිය යුතුය.
- අවසර ලබාදී ඇති උපකරණවලට අමතරව වෙනත් විකාශන උපකරණ සවිකිරීම නොකළ යුතුය.
- ඇන්ටනා යෙදීමේදී විදුලි සංදේශ කොමිසමේ මාර්ගෝපදේශ අනුව කොමිසම විමසා සිදුකළ යුතුය.
- විකාශන උපකරණ ක්‍රියාකරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් යෙදවිය යුතුය.
- බලපත්‍රය අවසන් වීමට දින 60කට පෙර නව අයදුම්පත්‍රයක් සඳහා ඉල්ලුම්කළ යුතුය.
- බලපත්‍ර කොන්දේසි කඩකිරීම, තහනම් විකාශන උපකරණ භාවිතා කිරීම, අවසර ලබාදී නොමැති තරංග ආයාමයන් භාවිතා කිරීම මත විදුලි සංදේශ කොමිෂන් සභාවට ඕනෑම මොහොතක බලපත්‍රය අවලංගු කළ හැකිය,

#### ගාස්තු

1996 ජුනි 25 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ගුවන් විදුලි තරංග භාවිතා කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේදී අයකරන ගාස්තු නියම කර තිබේ.

[12] http://www.trc.gov.lk/2014-05-12-12-36-13/frequency-licence.html

# 5. විකාශන අන්තර්ගතයන් නියාමය සඳහා ගෙන ඇති පියවර

### 5.1. රූපවාහිනී විකාශන අන්තර්ගතය නියාමනය කිරීම පිළිබඳ ප්‍රතිපාදන

**තහනම් අන්තර්ගතයන්**

ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් ලබාදෙන රූපවාහනි බලපත්‍රවල ඇති කොන්දේසි විවිධ වේ. එබැවින් එක් එක් විකාශකයින් වගකිව යුතු වන්නේ එක් එක් කොන්දේසිවලටය. එම කොන්දේසිවල ඒකමිතියක් නොමැත. එබැවින් අන්තර්ගතය නියාමයනය පිළිබඳ වූ ප්‍රතිපාදනයන් ද විවිධය.

රූපවාහිනී විකාශන බලපත්‍ර 34 ක විකාශන අන්තර්ගතයන් සම්බන්ධව විශේෂ සීමාවන් දක්වා ඇත. ඒ අනුව පහත සඳහාන් පරිදී වැඩසටහන් අන්තර්ගතයන් විකාශනය කිරීම අදාල විකාශන බලපත්‍රය අවලංගු කිරීමට හේතුවන බව එම බලපත්‍රවල දක්වා ඇත. එනම්

I. නීතිය හා සාමය කඩකිරීමට පෙළඹවීම
II. වාර්ගික හෝ ආගමික සාමය කඩ කිරීමට පෙළඹවීම
III. රටේ නීතිය උල්ලංඝනය කිරීම
IV. සාදාචාරාත්මක වැරදි සහ /හෝ අශෝභන
V. ජාතික ආර්ථික අරමුණුවලට අනර්ථයක් සිදුකිරීම
VI. මහජන සෞඛ්‍යයට අනර්ථනයක් සිදු කිරීම
VII. කාන්තාවන් ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාදයන්ට අනර්ථයක් සිදුකිරීම
VIII. රූපවාහිනී විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම, ප්‍රමිතීන් හා පරිචයන් උල්ලංඝනය කිරීම

(මෙම කරුණු එක් එක් බලපත්‍රවල තරමක් වෙනස් ලෙස සඳහාන් කර ඇත)

මෙසේ විකාශන අන්තර්ගතය පිළිබඳ සීමාවන් දක්වා ඇති විකාශන බලපත්‍රලාභී ආයතන වන්නේ

1. Asia Broadcasting Corporation
2. Sky Television and Radio Network
3. Lak View PVT LTD
4. Tharunyata Hetak Media Network
5. Yellowwin Media Pvt Ltd
6. Future Sat Com Holding
7. VIS Broadcasting
8. Sri Global Television Company
9. Ask Media (PVT)LTD
10. Ritz Asia(Pvt)Ltd
11. Satis Agency (Pvt)Ltd
12. Shraddha Media Network

13. Trymas Media Network
14. Wijaya Network pvt Ltd
15. J Lanka Group of Company
16. Dialog Television
17. Carlton Sport Network (Pvt)Ltd
18. EAP Network(pvt)Ltd
19. Rangiri Dambulla Development Foundation
20. Dilog Television(Pvt) Ltd (IPTV)
21. Sri Lanka Telecom Limited (IPTV)
22. Mobitel (pvt)Ltd (Moble TV)
23. Dish TV Lanka (Pvt) Ltd ( Satellite TV)
24. The Buddhist Broadcasting Services (Guarantee) Ltd ( Setellite TV)
25. Voice of Asia Network(Pvt) Ltd (Setellite TV)
26. Diolog Television (Pvt) Ltd (Setelite TV)
27. Ask Cable Vision Private Limited (Setellite TV)
28. Lanka Broad Band Network(Pvt) Ltd ( Cable TV)
29. Vocie of Asia Network (Pvt) Ltd (Cable TV)
30. City Cable Link (Pvt) Ltd (Cable TV)
31. Lanka Cable & Satellite Network (Pvt) Ltd ( Cable TV)
32. Dialog Television (Pvt) Ltd ( Cable TV)
33. Ask Cable Television Private Limited (Cable TV)
34. Tryma Media Network (Private) Ltd (Cable TV)

අනෙක් විකාශන බලපත්‍ර 18 හි මෙවැනි සදහනක් නොමැත.

මෙම කොන්දේසි අනුව විකාශන අන්තර්ගතයන් පවත්වාගෙන යනවාද නැද්ද යන්න පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සිදුකිරීම සඳහා යාන්ත්‍රණයක් පත්කර නොමැත.

**ආචාර ධර්ම හා පරිචයන්වලට අනුකූල වීමේ කොන්දේසිය**

රූපවාහිනී විකාශන අන්තර්ගතයන් සම්බන්ධයෙන් ප්‍රමිතියක් පවත්වාගෙන යාම සඳහා සෑම වැඩසටහනක්ම ශ්‍රී ලංකා ජාතික රූපවාහිනී සංස්ථාව විසින් අනුගමනය කරන ලද ආචාරධර්ම හා පරිචයන් ට අනුකූලව පවත්වාගෙන යා යුතු බවට විකාශන බලපත්‍ර 47 කම ඇතුලත් විය,

නමුත්

1. MGM Networks
2. J Lanka Group of Company
3. Wijaya Network pvt Ltd

යන ආයතන වෙත නිකුත් කර ඇති විකාශන බලපත්‍රවල සඳහාන් වූයේ අමාත්‍යතුමා විසින් සකස්කරන ලද විකාශන ආචාරධර්මවලට එකගව විකාශන කටයුතු සිදුකල යුතු බවයි. නමුත් එම ආචාර ධර්ම මොනවාද යන්න සඳහාන්ව නොතිබිණි.

Power House PVT LTD ආයතනය වෙත නිකුත් කර ඇති විකාශන බලපත්‍රයේ සඳහාන් වන්නේ වෙළද දැන්වීම් ප්‍රචාරණයේදී රූපවාහිනී සංස්ථාව මගින් පිළිගන්නා ලද ආචාර ධර්ම හා පරිචයන් ට අනුකූලව වෙළද දැන්වීම් විකාශනය කල යුතු බවයි.

Dialog Television ආයතනය වෙත නිකුත් කර තිබෙන පෑටීවී රූපවාහිනී විකාශන බලපත්‍රයේ සඳහාන් වූයේ යම් වැඩසටහනක් මගින් විකාශණ ආචාර ධර්ම කඩ කිරීම බලපත්‍රය අවලංගු කිරීමේ හේතුවක් වන බවයි. නමුත් එම ආචාර ධර්ම මොනවාද යන්න සඳහාන් කර නොතිබිණි.

කෙසේ නමුත් මෙම කොන්දේසි අනුව විකාශන අන්තර්ගතයන් පවත්වාගෙන යනවාද නැද්ද යන්න පිළිබඳව විධිමත් අධීක්ෂණයක් සිදුකිරීම සඳහා කිසිදු යාන්ත්‍රණයක් පිහිටුවා නැත.

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අනුගමනය කරන විකාශන ප්‍රමිතීන් හා ආචාර ධර්ම**

ශ්‍රී රූපවාහිනී සංස්ථාව විසින් මේ වන විට "වෙළඳ දැන්වීම් විකාශනය පිළිබඳව ප්‍රමිතීන් හා පරිචයන් සදංග්‍රහක් (code of Advertising Standards and Practice) " හදුන්වාදී ඇත. එමගින් රූපවාහිනී සංස්ථාවේ නාලිකාවන් හි වෙළඳ දැන්වීම් විකාශනය සිදු කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලබාදී ඇත. එසේම රූපවාහිනී සංස්ථාවේ ටෙලි නාට්‍ය සහ සංගීත වැඩසටහන් විකාශනයන් හිදී අනුගමනය කිරීම සඳහා "ටෙලිනාට්‍ය සහ සංගීත වැඩසටහන් පිළිබද ප්‍රතිපත්ති මාලාව" හදුන්වාදී ඇත,

මේ හැර විකාශන බලපත්‍රවල සඳහාන් කර ඇති පරිදී රූපවාහිනී සංස්ථාව විසින් විකාශනයන් සම්බන්ධ වෙනත් ප්‍රමිතින් හෝ ආචාර ධර්ම හදුන්වාදී නොමැත,

නමුත් ඉහත කී බලපත්‍රවල සඳහාන් වන කොන්දේසි අනුව සිය විකාශනයන් හිදී ඉහත කී මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට එම බලපත්‍රලාභි විකාශන ආයතනයන්ට වගකීමක් පැවරී ඇත,

නමුත් එසේ විකාශන අන්තර්ගතයන් නියමිත පරිදී සිදුකරන්නේද යන්න සොයා බැලීමේ යාන්ත්‍රණයක් ගොඩනගා නැත,

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ සඳහාන් වන ප්‍රමිතීන්**

රූපවාහිනී සංස්ථා පනතේ 7(2) වගන්තිය සංස්ථාව විසින් ප්‍රචාරය කරනු ලබන වැඩසටහන් වල අන්තරගත ප්‍රමිතිය පිළිබඳ සඳහාන් කරනු ලබයි. ඒ අනුව සෑම වැඩසටහනක්ම පහත සඳහාන් නියමයන්ට අනුකූල වන බවට සෑහීමකට පත් වීම සංස්ථාවේ යුතුකම වන බව එහි සඳහාන් කරයි. එනම්

අ)- මනා රසවින්දනයකට නැතහොත් ශිෂ්ටත්වයට හානිකර හෝ අපරාධ කිරීමට පොළඹවන හෝ කැළඹීමකට තුඩු දෙන හෝ යම් වාර්ගික හෝ ආගමික හැඟීම්වලට හානිකර හෝ මහජන හැඟීම්වලට හානිකර හෝ මහජන හැඟීම්වලට හානි කළ හැකි කිසිවක් ඒ වැඩ සටහනක ඇතුළත් නොකෙරෙන බව

ආ)- වැඩසටහන්වල යථා පරිදී ස්ථානික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර වශයෙන් තුලනයක් ද වැඩසටහන්වල විෂය කරුණු අතින් තුලනයක් සහ සමාන්‍යයෙන් උසස් ගුණ තත්වයක් පවත්වාගෙන යන බව

ඇ)- වැඩසටහන්වල ඇතුළත් කරනු ලබන(කවර වූ හෝ ආකාරයේ) යම් ප්‍රවෘත්ති නිසි පරිදී නිවැරදිව හා පරක්ෂතාතීව හා මහජන යහපත පිළිබද නිසි සැලකිල්ලෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන බව.

මේ අනුව මෙම නියමන්ට අනුකූලව අන්තර්ගතයන් පවත්වාගෙන යාමට ජාතික රූපවාහිනියේ ව්‍යවස්ථාපිත වගකීමක් වන නමුත් එය පුද්ගලික නාලිකාවන්ට අදාල වන්නේ අදාල බලපත්‍රයේ කොන්දේසියක් ලෙස සඳහාන් වන්නේ නම් පමණි.

**අමාත්‍යවරයා විසින් නියෝග පැනවීම පිළිබඳව ප්‍රතිපාදන**

ටෙලිවිෂන් විකාශනයන්ට අදාලව නියමයන් පැනවීම පිළිබද ප්‍රතිපාදන 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 31 වගන්තිය මගින් සලසා ඇත. ඒ අනුව එම නියෝග ගැසට් පත්‍රයේ පල කිරීම මගින් පැනවීමට අමාත්‍යවරයාට බලය පවතී. ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව අදාල නියෝග සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.

මෙම වගන්තියේ ප්‍රතිපාදන භාවිතා කරමින් රූපවාහිනී විකාශනයන්හි අන්තර්ගතය නියාමනය කිරීම සඳහා අවශ්‍ය නියමයන් පැනවීමේ හැකියාව විෂයභාර අමාත්‍යවරයාට ඇත. මෙම වගන්තිය භාවිතා කරමින් වෙනත් ආකාරයේ නියෝග පනවා ඇතත් විකාශන අන්තර්ගතයන් නියාමනය කිරීම සඳහා මෙතෙක් නියෝග පනවා නැත.

**2005 රූපවාහිනී විකාශන පිළිබද උපදේශක කාරක සභා නියෝග**

1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 29 වන වගන්තිය සමග කියවිය යුතු 31 වන වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ගුවන් විදුලි විකාශන පිළිබද උපදේශක සභා නියෝග පනවා ඇත. මෙම නියෝග 2006 ජනවාරි 04 වන දින හා අංක 1426/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත. නමුත් මෙම උපදේශක කාරක සභාවට බලය පවතින්නේ ජාතික රූපවාහිනී සංස්ථාව මගින් විකාශනය කරනු ලබන වැඩසටහන් සම්බන්ධව උපදෙස් ලබාදීම පමණි. එමගින් පුද්ගලික නාලිකාවන්ට සෘජු බලපෑමක් සිදුකළ නොහැක. නමුත් රූපවාහිනී සංස්ථාව සඳහා විකාශන ආචාරධර්ම හා පරිචයන් හදුන්වා දීම මගින් එම ආචාරධර්ම අනුගමනය කිරීම අනිවාර්ය කොන්දේසියක් වන පුද්ගලික විකාශන බලපත්‍ර ලබාගත් විකාශන මධ්‍යස්ථානවල වැඩසටහන් අන්තර්ගතයන් යම් ආකාරයකට නියාමනය කළ හැකිය. නමුත් මෙතෙක් එවැනි පියවර ගෙන නොමැත.

## 5.2. ගුවන් විදුලි විකාශන අන්තර්ගතය නියාමනය කිරීම පිළිබඳ ප්‍රතිපාදන

**තහනම් අන්තර්ගතයන්**

ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අමාත්‍යවරයා විසින් ගුවන් විදුලි සංස්ථා පනත යටතේ ලබාදෙන බලපත්‍රවල විකාශන අන්තර්ගතයන් නියාමනය සඳහා කොන්දේසි ඇතුළත් කර ඇත. අමාත්‍යවරුන් විසින් නිකුත් කරන ලද බලපත්‍රවල කොන්දේසි අතර ඒකමිතියක් නොමැත,

එසේ වුවද ගුවන් විදුලි බලපත්‍ර 13ක බලපත්‍ර කොන්දේසියක් ලෙස ඇමතිවරයාට විකාශන බලපත්‍රයක් අහෝසිකල හැකි අවස්ථාවන් පිළිබඳව සඳහාන් වේ. එහි සඳහාන් වන විකාශන බලපත්‍ර අවලංගු කළ හැකි අවස්ථාවන් යටතට විකාශන වැඩසටහන් වල අන්තර්ගතයන් පිළිබඳව ද සඳහාන් වේ. ඒ අනුව පහත සඳහාන් අන්තර්ගතයන් ගෙන් යුතු වැඩසටහන් විකාශනය කිරීම බලපත්‍ර අවලංගු කළ හැකි අවස්ථාවන් ලෙස දක්වා තිබේ.

I. නීතිය හා සාමය කඩකිරීමට පෙළඹවීම

II. වාර්ගික හෝ ආගමික සාමය කඩ කිරීමට පෙළඹවීම

III. රටේ නීතිය උල්ලංඝනය කිරීම

IV. සාදාචාරාත්මක වැරදි සහ /හෝ අශෝභන අන්තර්ගතයන් විකාශනය කිරීම

V. ජාතික ආර්ථික අරමුණුවලට අනර්ථයක් සිදුකිරීම

VI. මහජන සෞඛ්‍යයට අනර්ථනයක් සිදු කිරීම

VII. කාන්තාවන් ගේ සහ ළමයින්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාදයන්ට අනර්ථයක් සිදුකිරීම

VIII. ගුවන් විදුලි විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම, ප්‍රමිතීන් හා පරිචයන් උල්ලංඝනය කිරීම

මෙම කොන්දෙසිය ඇතුලත් වන ගුවන් විදුලි විකාශන බලපත්‍රලාභී ආයතන වනුයේ

1. Asia Broadcasting Corporation
2. Lak View PVT LTD
3. Tharunyata Hetak Media Network
4. Yellowwin Media Pvt Ltd
5. VIS Broadcasting(Pvt)Ltd
6. Globaal Radio Broadcasting (pvt)Ltd
7. Ritz Asia(Pvt)Ltd
8. Trymas Media Network
9. J Lanka Group of Company
10. Rangiri Sri Lanka Media Network
11. M/S Colombo Communication (Pvt)Ltd
12. The Fried Network(Pvt)Ltd
13. Lakviru TV & Radio Network

ඉතිරි බලපත්‍ර 13හි මෙවැනි විකාශන අන්තර්ගතයේ සීමාවන් පිළිබඳව මෙවැනි සීමාවක් දක්නට නොලැබේ,

නමුත් මෙම ආකාරයේ වැඩසටහන් විකාශනය වන්නේදැයි සොයාබැලීම සඳහා යම් කිසි විමසුම් යාන්ත්‍රණයක් විධිමත්ව ක්‍රියාත්මක නොවේ.

වැඩසටහන් විකාශනයේදී ආචාර ධර්ම පිළිපැදීම

විකාශන බලපත්‍ර 12 ක සඳහාන් වුයේ ගුවන් විදුලි සංස්ථාව විසින් අනුගමනය කරන නියමයන්,ප්‍රමිතීන් යා ආචරධර්මවලට අනුකූලව වැඩසටහන් විකාශනය කළ යුතු බවයි. එසේ සඳහාන් වූ බලපත්‍රලාභී ආයතන වනුයේ

1. Colombo Communication
2. Maharajah Organization
3. Teleshan Network
4. ASSET Media pvt LTD (ASSET radio broadcasting)
5. TNL Radio Network
6. Ru-Ras Lanka pvt ltd
7. Small Tea Estates Development Authority
8. Lanka Television Network

9. Voice of Asia Network
10. People's Media Network PVT
11. Ritz Asia
12. Trymas Media Network

තවත් බලපත්‍ර 11 සඳහාන් වන්නේ අමාත්‍යංශය විසින් සම්පාදනය කරන ලද ගුවන් විදුලි ආචාර ධර්ම වලට අනුකූලව විකාශන කටයුතු සිදුකල යුතු බවයි, එම බලපත්‍ර සමග අදාල ආචාරධර්ම පද්ධතියේ පිටපතක්ද ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර තිබිණි. එසේ සඳහාන් වූ බලපත්‍රලාභී විකාශන ආයතන වනුයේ

1. MGM Networks
2. Power House PVT LTD
3. Rangiri-Sri Lanka Media Metwork
4. Lakviru TV & Radio Network
5. Lak View PVT LTD
6. The Friend Media Network
7. Tharunyata Hetak Media Network
8. Asia Broadcasting Corporation
9. Yellow Win Media Pvt Ltd
10. VIS Broadcasting
11. Globle Radio Broadcasting Company

J Lanka Group of Company ආයතනයට ලබාදී ඇති බලපත්‍රයේ බලපත්‍රය අවලංගු කරන කොන්දේසියක් ලෙස "ගුවන් විදුලි ආචාර ධර්මවලට අනුකූල නොවන ලෙස වැඩසටහන් විකාශනය කිරීම" යන්න දක්වා ඇත. නමුත් කුමන ආයතනය විසින් සම්පාදනය කල ගුවන් විදුලි විකාශන අචාරධර්ම පිළිපැදිය යුතුද යන්න සඳහාන් කර නොමැත.(මෙම බලපත්‍රලාභී ආයතනය විසින් මෙතෙක් විකාශන කටයුතු ආරම්භ කර නොමැත)

LTTE Peace Secretariat ආයතනයට ලබාදී ඇති බලපත්‍රයේ ගුවන් විදුලි විකාශන ආචාර ධර්ම පිළිබඳව කිසිදු සදහනක් නොමැත. මෙම ආයතනයේ විකාශන බලපත්‍රය 2009 වසරේදී අවලංගු කර ඇත.

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව අනුගමනය කරන විකාශන ප්‍රමිතීන් හා ආචාර ධර්ම**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් මේ වන විට "ප්‍රවෘත්ති මාර්ග දර්ශක" හදුන්වාදී ඇත. එමගින් ගුවන් විදුලි සංස්ථාවේ නාලිකාවන් හි ප්‍රවෘත්ති විකාශනයන් සිදු කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලබාදී ඇත. එසේම ගුවන් විදුලි සංස්ථාවේ විකාශනයන් සඳහා වෙළද දැන්වීම් විකාශනයේදී පිලිගතයුතු " වෙළද ව්‍යාපාර මෙහෙයුම් නීති රීති සංග්‍රහය" හදුන්වාදී ඇත. මේ හැර විකාශන බලපත්‍රවල සඳහාන් කර ඇති පරිදී ගුවන් විදුලි සංස්ථාව විසින් විකාශනයන් සම්බන්ධ වෙනත් ප්‍රමිතින් හෝ ආචාර ධර්ම හදුන්වාදී නොමැත,

නමුත් ඉහත කී බලපත්‍රවල සඳහාන් වන කොන්දේසි අනුව සිය විකාශනයන් හිදී ඉහත කී මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට එම බලපත්‍රලාභි විකාශන ආයතනයන්ට වගකීමක් පැවරී ඇත,

එසේ විකාශන අන්තර්ගතයන් නියමිත පරිදී සිදුකරන්නේද යන්න සොයා බැලීමේ යාන්ත්‍රණයක් ගොඩනගා නැත,

**වැඩසටහන් අන්තර්ගතය නියාමනය කිරීම සඳහා නියෝග පැනවීම**

1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ 44(4) වගන්තිය සමග කියවිය යුතු 46 වගන්තිය යටතේ ගුවන් විදුලි විකාශනයන්ට අදාලව නියෝග පැනවීමේ බලය අමාත්‍යවරයාට පවරා ඇත. එම නියෝග ගැසට් පත්‍රයේ පල කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. නමුත් මේ සඳහා වන නියෝග මෙතෙක් අමාත්‍යවරයා විසින් පවරා නැත.

**2005 ගුවන් විදුලි විකාශන පිළිබඳව උපදේශක කාරක සභා නියෝග**

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 46 වන වගන්තිය සමග කියවිය යුතු 45 වන වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ගුවන් විදුලි විකාශන පිළිබඳව උපදේශක සභා නියෝග පනවා ඇත. මෙම නියෝග 2006 ජනවාරි 04 වන දින හා අංක 1426/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇත. නමුත් මෙම උපදේශක කාරක සභාවට බලය පවතින්නේ ගුවන් විදුලි සංස්ථාව මගින් විකාශනය කරනු ලබන වැඩසටහන් සම්බන්ධව උපදෙස් ලබාදීම සඳහාය. එමගින් පුද්ගලික නාලිකාවන්ට සෘජු බලපෑමක් සිදුකල නොහැක. නමුත් ගවන් විදුලි සංස්ථාව සඳහා විකාශන ආචාරධර්ම හා පරිචයන් හදුන්වා දීම මඟින් එම ආචාරධර්ම අනුගමනය කිරීම අනිවාර්ය කොන්දේසියක් වන පුද්ගලික විකාශන බලපත්‍ර ලබාගත් විකාශන මධ්‍යස්ථානවල වැඩසටහන් අන්තර්ගතයන් යම් ආකාරයකට නියාමනය කල හැකිය.

# 6. විකාශන බලපත්‍ර හා අන්තර්ගතයන් නියාමය සඳහා වූ සම්මත නොවූ පනත් කෙටුම්පත්

## 6.1. පසුබිම

ටෙලිවිෂන් හා ගුවන් විදුලි සඳහා විකාශන බලපත්‍ර ලබාදීම හා එවායේ විකාශන අන්තර්ගතයන් නියාමනය සඳහා වන නීති තත්වයන්ද ඉතාමත්ම දුර්වල මට්ටමක පවතී. විවිධ අවස්ථාවන්හිදී ආණ්ඩු විසින් හා සිවිල් ක්‍රියාකාරීන් විසින් විකාශන බලපත්‍ර විදිමත් කිරීම සඳහා විකාශන අන්තර්ගතයන් නියාමනය සඳහා ගන්නා ලද උත්සාහනයන් කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදයන් විස්තර වේ. විශේෂත්වය වන්නේ මෙම පරිච්ඡේදයේ කථාකරන කිසිවත් නීතිමය වශයෙන් මෙතෙක් බලාත්මක වී නොතිබීමයි.

## 6.2. විකාශන කොමිෂන් සභා පනත් කෙටුම්පත -1990

1990 වර්ෂයේදී ජනාධිපති ආර්.ප්‍රේමදාස මහතා විසින් කැඳවන ලද සර්වපාක්ෂික සමුළුවේදී "මාධ්‍ය කොමිෂන් සභා පනත් කෙටුම්පත" පිළිබඳවද සාකච්ඡා කරන ලදී. පනත් කෙටුම්පතේ අරමුණ වූයේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය නියාමනය සඳහා ස්වාධීන ආයතනයක් ස්ථාපනය කිරීම මගින් මාධ්‍යය සඳහා වන දේශපාලන බලපෑම් අවම කිරීමයි. නමුත් මෙම කෙටුම්පතේ අන්තර්ගතය සම්බන්ධව විරුද්ධ පක්ෂ ජනමාධ්‍ය සංවිධාන සහ මානව හිමිකම් සංවිධාන දැඩි විරෝධය පල කිරීම නිසා කෙටුම්පත පිළිබද ඉදිරිකටයුතු සිදු නොවීය[13].

## 6.3. ශ්‍රී ලංකා විකාශන අධිකාරී පනත් කෙටුම්පත-1997

### 6.3.1. පසුබිම

රූපවාහිනී හා ගුවන් විදුලි සඳහා විකාශන බලපත්‍ර ලබාදීමේදී එය විධිමත් ලෙස සිදුකිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඉතාමත් අවම බව පසුගිය පරිච්ඡේද මගින් සාකච්ඡා කරන ලදී. විශේෂයෙන්ම ගුවන් විදුලි විකාශන බලපත්‍ර ලබාදීම ගුවන් විදුලි සංස්ථා පනත යටතේද රූපවාහිනී විකාශන බලපත්‍ර ලබාදීම සිදුකරන බව පැහැදිලි විය. එසේම එම බලපත්‍ර ලබාදීමේ බලය හිමිව ඇතිතේ විෂය භාර අමාත්‍ය තුමාටය. එබැවින් ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍ර ලබාදීම විකාශන අධිකාරියකට පැවරීම සඳහා වූ නීතිමය ප්‍රතිපාදන සැලසීම සඳහා මෙම පනත් කෙටුම්පත සම්පාදනය කරන ලදී.

1997 මාර්තු 24 වන දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පලකරන ලද මෙම කෙටුම්පතේ අරමුණ ලෙස සඳහාන් කර තිබුනේ "ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම විධිමත් කිරීම පිණිසද ශ්‍රී ලංකා විකාශන අධිකාරිය නම් වූ අධිකාරියක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද එම කාර්ය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද ඊට සම්බන්ධ හා අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද" යනුවෙනි.

### 6.3.2. යෝජිත විකාශන අධිකාරියේ සංයුතිය

විකාශන අධිකාරියේ සාමාජිකයින් වසර 3ක කාලයක් සඳහා පත් කරනු ලබයි. මෙම විකාශන අධිකාරියේ සාමාජිකයින් 11 දෙනෙකු යෝජනා කරන ලද අතර ඔවුන් පහත සඳහාන් නිල බලයෙන් පත් වන සාමාජිකයින් 6 දෙනෙකුත් සම්විත විය යුතු බවට යෝජනා කර තිබිණි

1. ප්‍රවෘත්ති හා ගුවන් විදුලි විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
2. රාජ්‍ය ආරක්ෂක විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
3. තැපැල් හා විදුලි සංදේශ විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
4. අධ්‍යාපන හා සංස්කෘතික විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
5. භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
6. ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්

---

[13] Page -40 - Report of the committee to Advise on the Reform of Laws Affecting Media Freedom and Freedom of Expression

මෙයට අමතරව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විකාශන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා ඇති තැනැත්තන් දෙදෙනෙකුද ඇතුලත් වන සාමාජිකයින් පස් දෙනෙක් . මෙම සාමාජිකයින් ගැසට් පත්‍රයේ පලකරනු ලබන දැන්වීමක් මගින් ඉවත් කිරීමේ හැකියාව අමාත්‍යවරයාට ලබාදී තිබිණි. එම ප්‍රතිපාදනය අධිකාරියේ ස්වාධිනත්වයට විශාල බාධාවක් විය.

### 6.3.3. විකාශන අධිකාරියේ කාර්යභාරය

අ. කාර්යක්ෂම තරගකාරී සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලන විකාශන කාර්මාන්තයක් සඳහා පරිසරයක් ඇති කිරීම.

ආ. රූපවාහිනී විකාශනය සහ ගුවන් විදුලි විකාශනය සම්බන්ධයෙන් විවිධත්වයක් ඇති කිරීමට උනන්දු කරවීම.

ඇ. විකාශන සේවා සලසන තැනැත්තන් විසින් උසස් තත්ත්වයේ සහ අලුත් වැඩසටහන් සැපයීම ප්‍රවර්ධනය කිරීම.

ඈ. මහජන යහපත පිණිස වන කරුණු තුලනාත්මකව ආවරණය කිරීම සඳහා දේශීය වශයෙන් වැදගත් කරුණු ප්‍රමාණවත්ව ආවරණය කිරීම සඳහාද, ඇති අවශ්‍යතාව සපුරාලනු පිණිස විකාශ සේවා සලසන්නන් උනන්දු කරවීම.

ඉ. මහජන සදාචාරය ආරක්ෂා කිරීමේ අදහස ඇතිව වෙළඳ දැන්වීම් ද ඇතුලු වැඩසටහන් ඉදිරිපත් කිරීම සඳහා විකාශන සේවා සලසන්නන් උනන්දු කරවීම.

ඊ. විකාශන සේවාවලට අදාළ පැමිණිලි භාර ගැනීම සඳහා විධිවිධාන සැලසීම.

උ. විකාශන මධ්‍යස්ථාන මගින් කලාකරුවන් උනන්දුකරවීමට සහ පිළිගැනීමක් ලබාදෙන බවට වගබලා ගැනීම.

ඌ. විකාශන සේවාවලට උපයෝගී වන සේවා සැලසීමේ නියුක්ත තැනැත්තන්ගේ දක්ෂතා වර්ධනය කිරීම, ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන වැඩසටහන් සංරක්ෂණය කිරීම සඳහා අරමුදලක් පිහිටුවීම.

පනත් කෙටුම්පත මගින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ සමහර වගන්ති සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ලදී. ඒ අනුව මෙම අධිකාරියේ බලපත්‍රයක් ලබා නොගෙන ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශනයක් පවත්වාගෙන යාම වරදක් ලෙස හදුන්වා දී තිබිණි. යෝජිත පනත බලාත්මක වීමෙන් මාස 6ක කාලයක් තුළ මෙතෙක් විකාශන බලපත්‍ර ලබාගෙන සිටි සියලුම දෙනාද නැවත බලපත්‍ර ඉල්ලුම්කළ යුතු වේ.

එසේම පනත යටතේ අමාත්‍යවරයාට නියෝග පැනවිය හැකි අතර එම නියෝග මගින් "වෙලද දැන්වීම් ඇතුළු වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී මෙම පනත යටතේ බලපත්‍ර ලද තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු ගුරු උපදේශ දැක්වීමද" සිදුකළ හැකිය.

### 6.3.4. පනත් කෙටුම්පත අභියෝගයට ලක්වීම

මෙම පනත් කෙටුම්පතේ 3(1),5(උ),7(7),10,11,17 සහ 19 වගන්ති ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 10සහ 14(1)(අ) ව්‍යවස්ථාවට පටහැනි බව පවසමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පුරවැසියන් 15 දෙනෙකු හා විකාශන ආයතන කිහිපයක් විසින් පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනුකරන ලදී[14]. පෙත්සම විභාග කල ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලද්දේ පනතේ 3(1),5(උ),7(7),10,11,17 සහ 19 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)අ ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති භාෂනයේ හා ප්‍රකාශනයේ අයිතියට ට 10 වන ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති සිතීමේ හා හෘදය සාක්ෂියේ නිදහසට පටහැනි බැවින් මෙම පනත් කෙටුම්පත නීත්‍යානුකූල වීමට නම් පාර්ලිමේන්තුවේ 2/3 ක ඡන්දයකට අමතරව ජනමත විචාරණයක් මගින්ද සම්මත විය යුතු බවයි.

### 6.4. ශ්‍රී ලංකාවේ විකාශන අධිකාරී පනත් කෙටුම්පත-1997-(විකල්ප)

ඉහත කී අතුකෝරල එදිරිව නීතිපති නඩුවේ පෙත්සම්කාර පාර්ශවයක් ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයද එක්විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වල එම පනත් කෙටුම්පත පටහැනි බැවින් එයට එරෙහි වුවද, ගුවන් විදුලි හා රූපවාහිනී විකාශනයන් නියාමනය සඳහා විකාශන අධිකාරියක් අවශ්‍ය බවත් එය ස්වාධින අධිකාරියක් විය යුතු බවත් සිවිල් සංවිධාන හා මාධ්‍ය සංවිධාන වල පිළිගැනීම විය. එබැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එක්ව "ශ්‍රී ලංකාවේ විකාශන අධිකාරී පනත් කෙටුම්පත" නැමති ලේඛණයක් සම්පාදනය කරන ලදී.

මෙම කෙටුම්පතේ අරමුණ වූයේ මහජන සුභ සිද්ධිය සඳහා විකාශනය කිරීමේ කාර්යයන් විධිමත් කිරීම සඳහා ස්වාධීන විකාශන අධිකාරියක් පිහිටුවීමයි. මෙම විකාශන අධිකාරිය මඟින්

- ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය වඩා විධිමත් කිරීම.
- මහජන විකාශන සේවාවන් හි ශක්තිය සහ පැවැත්ම ආරක්ෂා කිරීම.
- අන්තර් ජාතිකව පිළිගත් ප්‍රමිතියකට අනුව විකාශනයේදී තාක්ෂණය භාවිතා කිරීම තහවුරු කිරීම.
- විකාශන සේවාවන්ගේ තරංග මාලා උපරිම කාර්ක්ෂමතාවයකින් පවත්වාගෙන යාම
- විකාශණ කර්මාන්තය සඳහා ආචාර ධර්ම පද්ධතියක් හදුන්වාදීම

ආදිය මූලික වශයෙන් සිදු කිරීමට අපේක්ෂා කරන ලදී.

[14]Athukorale and others v Attorney General of Sri Lanka -

විකාශන අධිකාරිය ස්වාධීන ව පවත්වාගෙන යාම සඳහා එහි අධ්‍යක්‍ෂක මණ්ඩලය සාමාජිකයින් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් හත්දෙනා තෝරාගනු ලබන්නේ තිදෙනෙකුගෙන් යුතු තේරීම් මණ්ඩලයක් මඟිනි. එම තේරීම් මණ්ඩලය පත්වන්නේ

- අග්‍රවිනිශ්චයකාරවරයා විසින් නම්කරනු ලබන සාමාජිකයෙක්
- ප්‍රජා අයිතිවාසිකම් ව්‍යාපාරය විසින් නම්කරනු ලබන සාමාජිකයෙක්
- දැනට බලපත්‍රලාභින්ගේ නියෝජිතයින් විසින් පත් කරනු ලබන සාමාජිකයෙක් යනු වෙනි.

මෙම තිදෙනා විසින් පත්කරනු ලබන සාමාජිකයින් හත්දෙනා විකාශ ප්‍රතිපත්ති හා තාක්‍ෂණය, මාධ්‍ය නීති,තරංග සැලසුම් කිරීම, සංස්කෘතික කටයුතු, ව්‍යාපාරික කටයුතු, හා මුදල්, අලෙවිය පිළිබඳ ප්‍රවීණත්වයට පත් අයවලුන් විය යුතුය.

රජයේ නිලතල දරන්නන් දේශපාලනයේ නියතුවූවන් ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචියක් නොමැති වූවෙකු මෙම විකාශන අධිකාරියේ අධ්‍යක්‍ෂක මණ්ඩලයට නුසුදුස්සෝ වෙති.

## 6.5. ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය පනත් කෙටුම්පත-2017

### 6.5.1. ජනමාධ්‍ය අයිතිය සහ ප්‍රමිතිය සම්බන්ධයෙන් මහජන කතිකාවතක් ආරම්භ කිරීම

යහපාලන රජය පත්වීමෙන් පසුව ජනමාධ්‍ය අන්තර්ගතයන් නියාමනය සඳහා උනන්දුවක් දැක්වූ අතර 2016 නොවැම්බර් මස 09 වන දින අංක 22/2016 දරණ "ජනමාධ්‍ය අයිතිය සහ ප්‍රමිතිය සම්බන්ධයෙන් මහජන කතිකාවතක් ආරම්භ කිරීම" මැයෙන් යුතු කැබිනට් පත්‍රිකාවක් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලදී. මෙම කැබිනට් පත්‍රිකාවේ අරමුණ වූයේ "මුද්‍රිත මාධ්‍ය, විකාශන මාධය(ගුවන් විදුලි හා රූපවාහිනී) සහ මෙරට ලියාපදිංචි වෙබ් අඩවිවල ප්‍රවෘත්ති අන්තර්ගතයන් අන්තර් ජාතික පිළිගැනීමක් සහිත වෘත්තිමය ප්‍රමිති හා ක්‍රමවේද අනුව නියාමනය කිරීම සඳහා ස්වාධීන මණ්ඩඩලයක් ස්ථාපිත කිරීම" මහජන සංවාදයක් ආරම්භ කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගැනීමයි.

මෙම කැබිනට් පත්‍රිකාවට 2016 නොවැම්බර් 22 දින පැවති කැබිනට් රැස්වීමේදී අනුමැතිය ලැබිණි[15].

කැබිනට් අනුමැතිය අනුව මෙම මහජන කතිකාවත පවත්වාගෙන යාම සම්බන්ධව බලතල පවරණ ලද්දේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂක ජෙනරාල්වරයා වෙතය. ඒ අනුව එවකට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්‍ෂක ජෙනරාල් ලෙස කටයුතු කල ආචාර්ය රංග කලංසූරිය විසින් "උසස් මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීම සඳහා ජනමාධ්‍ය අයිතීන් හා ප්‍රමිතීන් ස්ථාපිත කිරීම වෙනුවෙන් මහජන අදහස් ලබාගැනීම" මැයෙන් පුවත්පත් දැන්වීම් සිංහල. දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් පලකරන ලදී. එසේම මෙම ජනමාධ්‍ය අයිතීන් හා ප්‍රමිතීන් ස්තාපිත කිරීමට අදාල සංකල්ප පත්‍රිකාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවියට ඇතුලත් කරන ලදී. ඉහතකී දැන්වීම මගින් 2016 දෙසැම්බර් 31 වන දිනට පෙර අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අතර ඒ අනුව අදහස් හා යෝජනා එකසිය විසිපහක් පමණ ලැබිණි[16].

එම අදහස් හා යෝජනාවන්ට අමතරව "ජනමාධ්‍ය ප්‍රතිසංස්කරණය සඳහා වන ජාතික ලේකම් කාර්යාලය- NSMR " විසින් දිස්ත්‍රික් මට්ටමින් අදහස් ලබාගැනීමක් සිදුකල අතර ඒ අතරතුරදී ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් මහා සංඝරත්නය, පුවත්පත් මණ්ඩලය, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, සහ පෞද්ගලික මාධ්‍ය ආයතන කළමණාකරුවන් සමග උපදේශන සැසිවාර කිහිපයක්ද පවත්වන ලදී,

### 6.5.2. ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය පනත් කෙටුම්පත

ඉහත කී සාකච්ඡා සහ අදහස් ලබාගැනීම් අවසානයේදී විජයානනද ජයවීර මහතා විසින් "ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය පනත" කෙටුම්පතක් සකස් කරන ලදී.

එකී කෙටුම්පත නම්කර තිබුනේ "ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබද ස්වාධීන මණ්ඩලය පනත" යනුවෙනි, ඒ අනුව එහි අරමුණ වූයේ ප්‍රවෘත්ති පිළබදව නියාමනයක් ඇති කිරීමය. මෙම කෙටුම්පතට අනුව "ප්‍රවෘත්ති මාධ්‍ය ස්වාධීන මණ්ඩලය" නමින් මන්ඩලයක් පිහිටුවනු ලබන අතර එම මණ්ඩලයේ පරමාර්ථය වන්නේ මාධ්‍ය නිදහස සුරක්ෂිත කිරීම සදහ ප්‍රවෘත්ති මාධ්‍යවල තත්වය ඉහළ මට්ටමකට දියුණු කිරීම වේ.

මෙම මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යයක් වනුයේ සියලුම පරදු පර්ශවයන් සමග සාකච්ඡාකර ප්‍රවාත්ති සම්බන්ධව ව්‍යවහාර සංග්‍රහයක් සකස් කර පිළිගැනීමට ලක් කිරීමය.(කෙටම්පතේ 36(ආ) II වගන්තිය) මෙම ව්‍යවහාර සංග්‍රහය කඩකරනු ලබන මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීම ද මෙම මණ්ඩලයට පැවරෙනු ඇත.

මණ්ඩලයේ සංයුතිය ඉතාමත් ස්වාධීන ආකාරයට තෝරාගනු ලබන සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත වේ.

---

[15] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=7260
[16] PMO/06/03/NC/18/2017 අංක සහ 2017 ජූලි 10 දින දරණ අමාත්‍ය මණ්ඩල සටහන

### 6.5.3. කැබිනට් අනු කමිටුව පත් කිරීම

පසුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් අංක හා 2017 ජුලි 10 දරණ කැබිනට් මණ්ඩල සටහන 2017 ජුලි 11 වන දින කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. එකී කැබිනට් මණ්ඩල සටහන මගින් 2016 නොවැම්බර් 11 වන දින කැබිනට් මණ්ඩල අනුමැතිය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව කැබිනට් මණ්ඩලය දැනුවත් කරමින් ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රමිතිගත කිරීම සම්බන්ධ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා කැබිනට් අනුකමිටුවක් පත්කිරීම සඳහා කැබිනට් අනුමැතිය ඉල්ලා සිටින ලදී[17].

ඒ අනුව පහත සඳහාන් සාමාජිකයින්ගෙන් යුතු කැබිනට් අනු කමිටුවක් ඒ සඳහා පත් කරන ලදී.

1. ගරු මංගල සමරවීර මැතිතුමා- මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍ය
2. ගරු ආචාර්ය සරත් අමුණුගම මැතිතුමා විශේෂ කාර්යය භාර අමාත්‍ය
3. ගරු(වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා- සෞඛ්‍යය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
4. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා- ඉඩම් සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය
5. ගරු කරුණාරත්න පරණවිතාරණ මැතිතුමා- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍ය (කමිටුවේ කැදවුම්කරු)[18]

දැනට සිවිල් සමාජයේ සහ අර්ධ රාජ්‍ය මට්ටමෙන් ආරම්භකර ඇති මෙම ක්‍රියාවලිය පොදු කර්තව්‍යයක් වශයෙන් සලකා සම්පූර්ණ ක්‍රියාවලිය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශය මගින් පවත්වාගෙන යාමටද මෙහිදී තීරණය විය.

අදාල කටයුතු පිළිබඳව මාස 2ක් තුල කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම කැබිනට් අනුකමිටුවට පැවරුණි.

කෙසේ නමුත් 2020 වසරේ මාර්තු මාසයේ පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක්ම මෙම කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් නොවුනි.

### 6.6. විකාශන අධිකාරී කොමිෂන් සභා පනත් කෙටුම්පත-2018

2015 බලයට පත් වූ යහපාලන රජය ගුවන් විදුලි හා රූපවාහිනී බලපත්‍ර නියාමනය කිරීම පිළිබඳව අවධානයක් යොමුකල අතර ඒ අනුව ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් “ගුවන් විදුලි හා රූපවාහිනී බලපත් නිකුත් කිරීම නියමානුකූල කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක්” පිහිටුවන ලදී. 2017 වසරේදී පත් කරන ලද එම ක්‍රියාකාරී කමිටුව පහත පරිදී වේ

- මහාචාර්ය රොහාන් සමරජීව(සභාපති)
- විජයානන්ද ජයවීර
- ආචාර්ය ප්‍රදීප් වීරසිංහ
- එම්.ජේ.ආර්.ඩේවිඩ්
- සුදර්ශන ගුණවර්ධන
- විජේදාස හේවගේ

මෙම කමිටුවේ අවසන් වාර්ථාව 2018 වර්ෂයේදී ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත භාරදෙන ලද අතර එකී අවසන් වාර්ථාව සමග “සාකච්ඡාමය අවශ්‍යතාවයන් සඳහා විකාශන අධිකාරී කොමිෂන් සභා පනත් කෙටුම්පතක්” ඉදිරිපත් කරන ලදී.

මෙම යෝජිත පනත් කෙටුම්පත අනුව විකාශන නියාමන කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයන් වන්නේ

- විකාශන බලපත්‍ර ලබාදීම
- විකාශන සේවා නියාමනය
- බලපත්‍ර ගාස්තු නියම කිරීම හා එකතු කිරීම
- විද්‍යුත් චුම්භක ආයාම පරාසය කළමණාකරණය කිරීම
- චර්යා සංග්‍රයක් ගොඩනැගීම
- මාධ්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- පනතේ කටයුතු සිදු කිරීම සඳහා නියෝග පැනවීම ආදිය වේ.

මෙම කෙටුම්පත සහිත අවසන් වාර්ථාව 2018 අගෝස්තු මාසයේදී කමිටුව විසින් ජනමාධ්‍ය අමාත්‍යවරයාට භාරදුන් නමුත් එය ඉන් ඉදිරියට යාමක් හෝ මහජන සංවාදයකට ලක්වීමක් සිදු නොවීය.

---

[17] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=7946

[18] PMO/06/03/NC/18/2017 අංක සහ 2017 ජුලි 10 දින දරණ අමාත්‍ය මණ්ඩල සටහන

### 6.7. ශ්‍රී ලංකා මාධ්‍ය අධිකාරිය (SLMA)- සංකල්ප පත්‍රිකාව 2019

### 6.7.1. පසුබිම

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් මාධ්‍යවේදීන් හා මාධ්‍ය සංවිධාන සමග පුළුල් සාකච්ඡාවකින් අනතතුරුව ශ්‍රී ලංකා මාධ්‍ය අධිකාරියක් පිහිටුවීම සඳහා සංකල්ප පත්‍රිකාවක් කෙටුම්පත් කර තිබේ. යෝජිත මාධ්‍ය අධිකාරිය පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවීමට යෝජනා කරන අතර එමඟින් ටෙලිවිෂන්,ගුවන් විදුලි, මුද්‍රිත සහ ඩිජිටල් නියාමනය කිරීම අපේක්ෂා කරයි.

### 6.7.2 . යෝජිත මාධ්‍ය අධිකාරියේ සංයුතිය

අධිකාරිය සාමාජිකයින් 13 දෙනෙක්ගෙන් සමන්විත පාලන මණ්ඩලයකින් පාලනය වෙනු ඇත. සාමාජිකයින් පහත දැක්වෙන කණ්ඩායම්වලට අයත් වෙති: ප්‍රකාශකයින්, මාධ්‍ය හිමිකරුවන්, ප්‍රධාන සංස්කාරකවරු, වාර්තාකරුවන්, පත්‍රකලාවේදී සමිති හා සංගම්, සිවිල් සමාජය සහ නීතිඥ සංගමය. ආණ්ඩුව පාලන කවුන්සිලයට එක් තැනැත්තෙක් නම් කරනු ඇත. සාමාජිකයින් විසින් සභාපති සහ නියෝජ්‍ය සභාපති තෝරා පත් කර ගනු ලැබේ. නම් කළ තැනැත්තන් අනුමත කිරීම සඳහා වූ යාන්ත්‍රණය හෝ මණ්ඩලය යෝග්‍ය ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලියක් හරහා සිදු කරනු ඇත - බොහෝ විට පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාව මඟින් සේවය ලබා ගත් පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක් වැනි ස්වාධීන නම් කරන කමිටුවක් මඟින් මෙම කාර්යභාරය ඉටු කරනු ඇත. සාමාජිකයින් පත් කළ හැක්කේ ලියාපදිංචි මාධ්‍ය ආයතනවලින් පමණි.

### 6.7.2 . යෝජිත මාධ්‍ය අධිකාරියේ ප්‍රධාන කාර්යයන්

මෙම මාධ්‍ය අධිකාරියට පහත සඳහාන් කාර්යයන් පැවරීමට යෝජනකර තිබේ.

- වෘත්තීය පරිච සංග්‍රහය උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි භාර ගැනීම
- පැමිණිලි අධිකාරියේ විෂය පථය තුළට වැටෙන බවට නිර්ණය කර ගැනීම සඳහා ඒවා සත්‍යාපනය කිරීම
- පැමිණිලි සමාලෝචනය
- පාර්ශ්ව දෙක සමඟ සංවාදය හරහා පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීම සහ විසඳීම
- විනිශ්චය කිරීම තීරණය කිරීම සහ පාර්ශ්වයන්ට දැනුම්දීම
- විසඳුම අධිකාරියේ වෙබ් අඩවියේ පළ කිරීම
- අදාළ වර්ෂයේ පැමිණිලි සහ විසඳුම් ඇතුළත් කිරීම සඳහා වාර්ෂික වාර්තාවක් පළ කිරීම
- වෘත්තීය පරිචය පිළිබඳ සංග්‍රහය සඳහා උපදේශන වෙනස්කම් ඉදිරිපත් කිරීම
- ඵලදායී ස්වයං-නියාමන ක්‍රමයකට අනුග්‍රහය දක්වන රීති සහ රෙගුලාසි නිකුත් කිරීම
- ලියාපදිංචි ආයතන පිළිබඳ තොරතුරු දත්ත සමුදායක් පවත්වා ගැනීම

මෙම සංකල්ප පත්‍රිකාව මේ වන විට සාකච්ඡා මට්ටමේ පවතින අතර එය සම්පූර්ණ කෙටුම්පතක් ලෙස සකස්කල පසු රජය මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කිරීම ශ්‍රී ලංකා පුවත්පත් ආයනතයේ අපේක්ෂාවයි.

### 6.8. උත්සාහයන් ව්‍යර්ථවීම

ඉහත කරුණු අනුව 1990 වර්ෂයේ සිටම විද්‍යුත් මාධ්‍ය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මෙන්ම ඒවායේ විකාශන අන්තර්ගතය නියාමනය කිරීම සඳහා විධිමත් නීති පැනවීම සඳහා උත්සාහනයන් රැසක් ගෙන ඇති නමුත් සාර්ථක වී නොමැති බව පැහැදිලි වේ.

විශේෂයෙන්ම 1990 සහ 1997 වර්ෂවලදී  රජය මෙම නියාමන සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා නීති කෙටුම්පත් කරන ලද්දේ මාධ්‍යවේදීන් මාධ්‍ය සංවිධාන හෝ මාධ්‍ය ආයතන සමග නිසි සාකච්ඡාවකින් තොරවය. එසේම සමස්ථ කෙටුම්පත් විශ්ලේෂණය කිරීමේදී දේශපාලන අධිකාරියේ බලපෑම අදාල අධිකාරීන් කෙරෙහි පැවතීම නිසා මාධ්‍ය සංවිධාන මෙන්ම මානව හිමිකම් ක්‍රියාකාරීන්ද එයට එරෙහි විය. සිවිල් සංවිධාන විසින් කෙටුම්පත් කල පනත් කෙටුම්පත් රජය කිසිදු විටෙක සැලකිල්ලට ගත්තේ නැත. 2016 වර්ෂයේදී රජය විසින් ගන්නා ලද උත්සාහනයන් එයට වඩා විවෘත ස්වරූපයක් ගත් නමුත් එවාද අවසානයේදී හුදු කෙටුම්පත්වලට පමණක් සීමා විය.

# 7. සමාප්තිය (නිරීක්ෂණ හා යෝජනා)

## 7.1. නිරීක්ෂණ

ගුවන් විදුලි හා රූපවාහිනී විකාශනයන්ට අදාල අණපනත් හා නියෝග මෙන්ම අදාල බලපත්‍ර මෙන්ම ජනමාධ්‍ය අමාත්‍යංශයේ හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිචයන් පිළිබඳවද පරිශීලනය කිරීමෙන් පහත කරුණු නිරීක්ෂණය කල හැකිවිය.

### 7.1.1. ගුවන් විදුලි සංස්ථා පනත යටතේ විකාශන බලපත්‍ර නිකුත් කිරීම

- ගුවන් විදුලි සංස්ථා පනත යටතේ විකාශන බලපත්‍ර නිකුත් කිරීමේදී ඒවායේ කිසිදු ඒකමිතියක් නොමැත.
- ගුවන් විදුලි විකාශණ බලපත්‍ර කිකුත් කිරීම සඳහා විනිවිද හා විවෘත ක්‍රමවේදයක් නොමැත.
- ගුවන් විදුලි විකාශන බලපත්‍ර නිකුත් කිරීම විධිමත් ව සිදුකිරීම සඳහා ගුවන් විදුලි සංස්ථා පනතේ 44(4) වගන්තිය සමග කියවිය යුතු 46 වගන්තිය මඟින් අදාල නියෝග පැනවීම සඳහා අමාත්‍යවරයාට බලතල තිබුනද මෙතෙක් එවැනි නියෝග පනවා නොමැත.
- විකාශන බලපත්‍ර සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශයට බලපත්‍ර ගාස්තු අයකරගැනීමට බලය තිබුනද ගාස්තු අයකර නොමැත.
- බලපත්‍ර අවලංගු කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව නැත.
- සමහර බලපත්‍රවල ගුවන්විදුලි සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන ගුවන් විදුලි විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම හා පරිචයන් අනුගමනය කල යුතු බවට දක්වා තිබුණද ගුවන් විදුලි සංස්ථාව එවැනි ලේඛනයක් ගැන නොදනී.(ගුවන් විදුලි සංස්ථාව විසින් විට "ප්‍රවෘත්ති මාර්ගදර්ශක" හා "වෙළඳ ව්‍යාපාර මෙහෙයුම් නීති රීති සංග්‍රහය" හදුන්වාදී ඇත.
- මෙතෙක් නිකුත්කර ඇති බලපත්‍ර සියල්ලම තාවකාලික බලපත්‍රවේ.

### 7.1.2.රූපවාහිනී සංස්ථා පනත යටතේ විකාශන බලපත්‍ර නිකුත් කිරීම

- රූපවාහිනී සංස්ථා පනත යටතේ විකාශන බලපත්‍ර නිකුත් කිරීමේදී ඒවායේ කිසිදු ඒකමිතියක් නොමැත.
- රූපවාහිනී විකාශණ බලපත්‍ර කිකුත් කිරීම සඳහා විනිවිද හා විවෘත ක්‍රමවේදයක් නොමැත.
- විකාශන බලපත්‍ර සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශයට බලපත්‍ර ගාස්තු අයකරගැනීමට බලය තිබුනද ගාස්තු අයකර නොමැත.-2010 වර්ෂයෙන් පසුව පුද්ගිලික රූපවාහිනී බලපත්‍ර නියෝග-2010 අනුව අයදුම්පත්‍රය සමග අයකරගන්නා රුපියල් ලක්ෂයක මුදල පමණක් අයකරගෙන ඇත,
- බලපත්‍ර අවලංගු කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව නැත,
- රූපවාහිනී සංස්ථා පනතේ 31 වන වගන්තිය යටතේ 2007 රූපවාහිනී විකාශන බලපත්‍ර නියෝග නිකුත් කර තිබුණද එමගින් විකාශන බලපත්‍ර ලබාදීම විධිමත් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත.
- සමහර බලපත්‍රවල රූපවාහිනී සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන ගුවන් විදුලි විකාශන හා වෙළඳ දැන්වීම් ආචාර ධර්ම හා පරිචයන් අනුගමනය කල යුතු බවට දක්වා තිබුණද ගුවන් විදුලි සංස්ථාව එවැනි ලේඛනයක් ගැන නොදනී. (රූපවාහිනී වෙළඳ දැන්වීම් පිළිබඳව හා ටෙලි නාට්‍යය හා සංගීත වැඩසටහන් සඳහා පමණක් මාර්ගෝපදේශ රූපවාහිනී සංස්ථාව සකස්කර ඇත)

- මෙතෙක් නිකුත්කර ඇති පෘථිවි රූපවාහිනී විකාශන බලපත්‍ර 33න් 32 ක්ම තාවකාලික බලපත්‍රවේ.
- විකාශන බලපත්‍ර කොන්දේසි අනුගමනය කිරීම පිළිබඳව හා කාර්යසාධනය අධීක්ෂණය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් කමිටුවක් පත් කරනු ලබන බවට ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කල ඇතැම් රූපවාහිනී විකාශන බලපත්‍රවල සඳහාන් වුවද ජනමාධ්‍ය අමාත්‍යංශය වෙතින් සිදුකරන ලද විමසීමේදී දැනගැනීමට ලැබුනේ එවැනි කමිටු පිහිටුවා නැති බවයි.
- රූපවාහිනී සංස්ථා පනතට අනුව ජාතික රූපවාහිනී සංස්ථාව හැර අනෙක් සෑම විකාශන මධ්‍යස්ථානයක්ම අමාත්‍යවරයාගෙන් බලපත්‍ර ලබාගත යුතු වුවද ස්වාධීන රූපවාහිනී සේවය සඳහා එවැනි බලපත්‍රයක් නිකුත් කර නොමැත.

### 7.1.3. විදුලි සංදේශ පනත යටතේ විකාශන බලපත්‍ර නිකුත් කිරීම

- විදුලි සංදේශ පනත යටතේ ගුවන් විදුලි තරංග සඳහා බලපත්‍ර ලබාදීම සඳහා 1996 අංක 02 දරණ විදුලි සංදේශ (ගුවන් විදුලි තරංග බලපත්‍ර) නියෝග පනවා ඇති අතර එමගින් අයදුම් කිරීමේ ක්‍රමවේදය ගාස්තු හා තරංග බලපත්‍රයේ ඒකමිතියක් ඇති කර ඇත.
- නමුත් එම නියෝග මගින් හෝ පනත මඟින් හෝ භාවිතය මගින් තරංග බලපත්‍ර ලබාදීම විවෘත හා විනිවිද ක්‍රමයක් බවට පත් කර නොමැත.
- සෑම බලපත්‍රයක් සඳහාම එකම ආකාරයේ කොන්දේසි මාලාවක් පනවා ඇත.
- බලපත්‍ර වාර්ෂිකව අලුත් කිරීමක් සිදුවේ.

### 7.1.4. විකාශන අන්තර්ගතයන් නියාමනය

- විකාශන අන්තර්ගතයන් නියාමනය සඳහා ගුවන් විදුලි හා රූපවාහිනී බලපත්‍ර යම් ප්‍රමාණයක ඇතුලත් කොන්දේසි මඟින් සීමිත උත්සාහයක් දරා ඇත.
- සමහර බලපත්‍රවල කොන්දේසි ලෙස විකාශන අන්තර්ගතයන් දින 60ක කාලයක් ඩිවිඩී තුල ආරක්ෂාකර තබාගැනීම හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ නිලධාරීන්ට විකාශන මධ්‍යස්ථාන පරීක්ෂා කිරීමේ බලය පවතින බව දක්වා තිබුනද එවැනි අධීක්ෂණයන් සිදුකළ බවට වාර්තා නොමැත.
- රූපවාහිනී විකාශනයන් නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 31 වන වගන්තිය යටතේ නියෝග පැනවීමට අමාත්‍යවරයාට ප්‍රතිපාදන සලසා තිබුණද එවැනි නියෝග පනවා නොමැත.
- ගුවන් විදුලි විකාශණයන් විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ අමාත්‍යවරයාට නියෝග පැනවීමේ ප්‍රතිපාදන සලසා තිබුණද මෙතෙක් එවැනි නියෝග පනවා නොමැත.
- විකාශනයන් නිසා යම් අසාධාරණයකට ලක්වූ පුරවැසියකුට පැමිණිල්ලක් කිරීමේ විධිමත් ව්‍යුහයක් නොමැත.

## 7.2. ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන ක්‍රියාවලියේ පවතින මූලික ගැටලු

### 7.2.1. විකාශන බලපත්‍ර ලබාදීම විනිවිද නොවීම

ගුවන් විදුලි සංස්ථාව හා රූපවාහිනී සංස්ථාව හැරුණ විට අනෙක් සියලුම ගුවන් විදුලි හා රූපවාහිනී විකාශනයන් සඳහා විෂයභාර අමාත්‍යවරයාගෙන් විකාශනය බලපත්‍රයක්ද සියලුම විකාශන කටයුතු ගුවන් විදුලි තරංග භාවිතා කිරීම සඳහා විදුලි සංදේශ කොමිෂන් සභාව වෙතින් අවසරයක්ද ලබාගත යුතුය. මෙම බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ආවෘත ක්‍රියාවලියකි. විශේෂ සබඳතා නොමැති පුද්ගලයන්ට ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශන බලපත්‍රයක් ලබාගත නොහැකිය.එසේම එම බලපත්‍ර ලබාදීම සිදුවන්නනේ ස්වාධීන අධිකාරියක් මගින් නොව දේශපාලන අධිකාරියක් වන අමාත්‍යතුමාගේ අභිමතය පරිදීය.

### 7.2.2. විකාශන බලපත්‍රවල ඒකමිතියක් නොවීම

ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති රූපවාහිනී විකාශන හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර පරීක්ෂා කිරීමේදී පෙනී යන කරුණක් වනුයේ එම බලපත්‍රල කිසිදු ඒකමිතියක් නොමැති බවයි. විශේෂයෙන්ම කොන්දේසි බොහොමයක් එකිනෙකට වෙනස්ය.මෙම තත්ත්වය තුල විකාශන ආයතනවලට ජනමාධ්‍ය අමාත්‍යංශය සමාන ලෙස නොසලකනවා මෙන්ම එකී මාධ්‍ය ආයතනවල ශ්‍රාවකයන්වද වෙනස්කමකට භාජනය කරයි.

### 7.2.3. විකාශන අන්තර්ගතයන් නියාමනය නොකිරීම

ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන අන්තර්ගතයන් නියාමනය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් කිසිදු පියවරක් ගෙන නොමැත. විකාශන බලපත්‍රවල යම් යම් කොන්දේසි සඳහාන් වුවද ඒවා නිශ්චිත අර්ථ සහිත ඒවා නොවේ.එමෙන්ම ගුවන් විදුලි සංස්ථා පනත තුල හා රූපවාහිනී සංස්ථා පනත තුල අමාත්‍යවරයාට අදාල නියාමනයන් සිදුකිරීම සඳහා නියෝග පැනවීමට බලය ලබාදී තිබුණද කිසිදු නියෝගයක් පනවා නොමැත.එසේම මෙහිදී අවධාරණය කල යුතු තවත් කරුණක් වනුයේ නියාමනය සඳහා නියෝග පැනවීමට බලය ඇත්තේ දේශපාලන අධිකාරියක් වන විෂය භාර අමාත්‍යතුමාට වන බැවින් නියෝග පැනවීම ස්වාධීන නොවන අතර දේශපාලනික අවශ්‍යතා මත ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන අන්තර්ගතයන් පාලනය කිරීමටද එමගින් ඉඩකඩ පවතින බවයි.

### 7.2.4. බලපත්‍ර කොන්දේසි කඩවීම පිළිබඳව පරීක්ෂාකාරී නොවීම

ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍රවල සඳහාන් කොන්දේසි (මෙම කොන්දේසි විවිධ බලපත්‍රවල විවිධ ලෙස දක්වා ඇත) නිසි පරිදී ඉටුකරන්නේද යන්න පිළිබඳව අමාත්‍යංශය මඟින් කිසිදු ආකාරයක විමසීමක් සිදු නොකරයි.ඒ සඳහා වන යාන්ත්‍රණයක්ද අමාත්‍යංශය තුල නොමැත. එසේම විකාශන බලපත්‍ර පිළිබඳව හෝ විකාශනයන් සිදුවන ආකාරය පිළිබඳව කිසිදු පසු විපරමක් සිදු නොකරයි. විශේෂයෙන්ම බලපත්‍රවල සදහන් පරිදී විකාශණ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමටවත් ක්‍රියාකර නොමැත. එමෙන්ම ඇතැම් විකාශන බලපත්‍රවල සඳහාන් වන පරිදී විකාශන ආයතනවල ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීම සඳහා වන කමිටු මේ වන තෙක් පත් කර නොමැත. එසේම බලපත්‍ර කොන්දේසි කඩකරන ලද්දේද යන්න පරීක්ෂා කිරීමට යාන්ත්‍රණයක්ද නොමැත.යම් ආකාරයකින් විකාශන අන්තර්ගතයක් නිසා යම් පුරවැසියකුට හෝ ප්‍රේක්ෂකයකුට යම් අගතියක් සිදුවුවද ඒ සඳහා පැමිණිලි කිරීම හෝ පැමිණිලි කිරීම සඳහා යාන්ත්‍රණයක් ගොඩනගා නොමැත.

### 7.2.5. මූලික නීති රාමුව මගින් සකස්කර ඇති යාන්ත්‍රණ ක්‍රියාත්මක නොවීම

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත හා රූපවාහිනී සංස්ථා පනත මගින් විකාශන අන්තර්ගතයන් නියාමනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා ඇති නමුත් ඒ සඳහා වන නියෝග මෙතෙක් පනවා නැත. එසේම 2005 වසරේ රූපවාහිනී හා ගුවන් විදුලි උපදේශක කාරක සභා  නියෝග පනවා ඇති නමුත් ඒ අනුව උපදේශක කමිටු පත් කර නොමැත. අමාත්‍යවරයාට විකාශන බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලපතල තිබුණද මේ වනතෙක් නිකුත් කර ඇති බොහෝ බලපත්‍ර තාවකාලික බලපත්‍ර වන අතර ස්ථිර විකාශන බලපත්‍ර නිකුත් කර නොමැත.

### 7.3. රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා වන යෝජනා.

- විකාශන බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා ස්වාධීන විකාශන නියාමන අධිකාරියක් පිහිටුවීම.
- එවැනි නීතියක් සම්මත වන තෙක් සියලු රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන බලපත්‍ර ඒක මිතියක් ඇති කිරීම සඳහා නැවත් විධිමත් බලපත්‍ර නිකුත් කිරීම.
- ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් විකාශන බලපත්‍ර ගාස්තු අයකර ගැනීම.
- විකාශන අන්තර්ගතය නියාමනය කිරීම සඳහා රූපවාහිනී සංස්ථා පනත යටතේ හා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නියෝග පැනවීම.
- රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනයන් අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන කමිටු පිහිටුවීම.
- ශ්‍රාවකයන්ට හා අගතියට පත්වන පුද්ගලයන්ට විකාශණ මධ්‍යස්ථානයන්ට එරෙහිව පැමිණිලි විභාග කිරීම සඳහා ආයතනයක් පිහිටුවීම සඳහා නියෝග මඟින් නීතිමය ප්‍රතිපාදන සැලසීම.
- දේශීය ප්‍රවෘත්ති විකාශනය සඳහා විධිමත් බලපත්‍ර නිකුත් කිරීම හෝ නව බලපත්‍ර තුල ඒ පිළිබඳව විධිමත් භාවයක් ඇති කිරීම.
- විකාශන බලපත්‍ර පිළිබඳව චෝදනා විමර්ශනය කිරීම හා කොන්දේසි කඩ කිරීම පරීක්ෂා කිරීම පිළිබඳව විධිමත් නීතිමය ප්‍රතිපාදන සම්පාදනය කිරීම.

# 8. ඇමුණුම්

I. ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව

II. රූපවාහිනී සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව

III. විදුලි සංදේශ පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලැයිස්තුව

**ඇමුණුම්-I**

| No | ආයතනය | බලපත්‍රය නිකුත් කල දිනය | නලිකා |
|---|---|---|---|
| 1 | Colombo Communication | 01.04.1992 | ශ්‍රී එෆ්එම් /රන් එෆ්එම්/E FM |
| 2 | Maharajah Organization | 12.05.1992 | සිරස එෆ්එම්/ Y FM/ Shakthi FM/ Yes Fm |
| 3 | Teleshan Network | 02.12.1993 | ඉසිර එෆ්එම් |
| 4 | Tea Small Holdings Developing Authority | 08.12.2000 | (2007-02-21 දින බලපත්‍රය අවලංගු කර ඇත) |
| 5 | TNL Radio Network | 24.10.2002 | Lite FM/ ටිවන්වල් රේඩියෝ/Rhythm FM |
| 6 | LTTE Peace Secretariat | 11.11.2002 | (2009-01-07 දින බලපත්‍රය අවලංගු කර ඇත) |
| 7 | Ru-Ras Lanka pvt ltd | 01.01.2004 | කිරුළ එෆ්එම් |
| 8 | ASSET Media pvt LTD (ASSET radio broadcasting) | 15.12.2004 | නෙත් එෆ්එම්/Allai FM |
| 9 | MGM Networks | 14.09.2005 | යාත්‍රා එෆ්එම්/ Max Radio |
| 10 | Power House PVT LTD | 19.10.2005 | දෙරණ එෆ්එම් |
| 11 | Lanka Television Network | 08.01.2006 | වී එෆ්එම් |
| 12 | Voice of Asia Network | 16.02.2006 | සියත එෆ්එම්/Real Radio/ Varnam FM/ Vettri FM/ Kiss FM |
| 13 | People's Media Network PVT | 31.05.2006 | Buddhist Radio |
| 14 | Rangiri-Sri Lanka Media Metwork | 16.10.2006 | රංගිරි ශ්‍රී ලංකා එෆ්එම් |
| 15 | Lakviru TV & Radio Network | 12.04.2007 | ශ්‍රද්ධා එෆ්එම් |
| 16 | Lak View PVT LTD | 25.05.2007 | ලක් එෆ්එම් |
| 17 | SatNet (Pvt) Ltd | 2007.07.19 | සත් එෆ්එම් (2017-04-06 දින බලපත්‍රය අවලංගු කර ඇත) |
| 18 | The Friend Media Network | 16.10.2007 | සෙත් එෆ්එම් |
| 19 | Tharunyata Hetak Media Network | 08.02.2008 | (2008-05-23 දින බලපත්‍රය අවලංගු කර ඇත) |
| 20 | Asia Broadcasting Corporation | 21.02.2008 | හිරු එෆ්එම්/ෂා එෆ්එම්/Sooriyan FM Sun FM/ Gold FM |
| 21 | Yellowwin Media Pvt Ltd | 10.03.2008 | (විකාශණ ආරම්භ කර නැත) |
| 22 | VIS Broadcasting | 16.05.2008 | සිත එෆ්එම්/රස එෆ්එම්/Red FM CRI (China Ra. Int.) |
| 23 | Globle Radio Broadcasting Company | 27.11.2008 | (විකාශණ ආරම්භ කර නැත) |
| 24 | Ritz Asia | 03.03.2011 | (විකාශණ ආරම්භ කර නැත) |
| 25 | Trymas Media Network | 27.09.2016 | Capital FM |
| 26 | J Lanka Group of Company | 12.03.2019 | (විකාශණ ආරම්භ කර නැත) |

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 44 වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති ගුවන් විදුලි විකාශන බලපත්‍රලාභි ආයතන**

- මූලාශ්‍ර-තොරතුරු ඉල්ලුම්පත්‍ර මගින් ලබාගත් ගුවන් විදුලි විකාශණ බලපත්‍ර පිටපත් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ වෙබ් අඩවිය-.

**ඇමුණුම් - II**

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 28 වන වගන්තිය යටතේ ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කර ඇති රූපවාහිනී විකාශන බලපත්‍ර හිමි ආයතන**

| No | බලපත්‍රලාභී ආයතනය | බලපත්‍ර ලැබූ දිනය | නාලිකා |
|---|---|---|---|
| 01 | The Maharaja Organization | 07.08.1991 | සිරස ටීවී/ශක්ති ටීවී/V1 TV |
| 02 | Teleshan Network pvt Ltd | 08.10.1992 | TNL TV |
| 03 | Eest West Information Systems New License owner Is E.A.P | 28.07.1993 | ස්වර්ණවාහිනී/ETV |
| 04 | I.W.S.Holding Company Ltd | 11.01.1995 | Art TV |
| 05 | Televison & Radio Network | 30.05.1996 | Not meítion |
| 06 | On Line National Lotteries pvt Ltd | 21.10.2003 | |
| 07 | Ru-Ras Lanka pvt ltd | 01.01.2004 | |
| 08 | Dialog Television | 2004.02.09<br>Re issued<br>08.01.2012 | විකාශන ආරම්භ කර නැත |
| 09 | ASSET Media pvt LTD | 09.02.2004 | |
| 10 | Power House PVT LTD | 09.02.2004 | දෙරන ටීවී |
| 11 | Lanka Broadcasting Network-LBN | 22.03,2004 | විකාශන ආරම්භ කර නැත |
| 12 | MGM Networks | 14.09.2005 | යාත්‍රා ටීවී/ Max TV |
| 13 | Lanka Television Network | 08.01.2006 | විකාශන ආරම්භ කර නැත |
| 14 | Voice of Asia Network | 16.02.2006 | සියත ටීවී<br>Varnam TV |
| 15 | People's Media Network PVT | 31.05.2006 | Buddhist TV |
| 16 | Sky Television and Radio Network | 12.12.2006 | Not meítion |
| 17 | Lak View PVT LTD | 25.05.2007 | විකාශන ආරම්භ කර නැත |
| 18 | Sat Net PVT LTD | 19.07.2007 | |
| 19 | Tharunyata Hetak Media Network | 08.02.2018 | |
| 20 | Yellowwin Media Pvt Ltd | 10.03.2008 | විකාශන ආරම්භ කර නැත |
| 21 | Future Sat Com Holding | 13.05.2008 | විකාශන ආරම්භ කර නැත |
| 22 | VIS Broadcasting | 16.05.2008 | CCTV News |
| 23 | Asia Broadcasting Corporation | 16.05.2008 | Hiru TV |
| 24 | Sri Global Television Company | 27.11.2008 | විකාශන ආරම්භ කර නැත |
| 25 | Ask Media | 22.-6.2010 | Dan TV |
| 26 | Ritz Asia | 03.03.2011 | විකාශන ආරම්භ කර නැත |
| 27 | Carlton Sport Network | 03.03.2011 | |
| 28 | Rangiri Dambulla Development Foundation | 18.08.2011 | Rangiri Sri Lanka TV |
| 29 | Satis Agency | 28.10.2015 | UTV |
| 30 | Shraddha Media Network | 04.11.2015 | ශ්‍රද්ධා ටීවී |
| 31 | Trymas Media Network | 01.12.2016 | Not meítion |
| 32 | Wijaya Network pvt Ltd | 22.02.2019 | විකාශන ආරම්භ කර නැත |
| 33 | J Lanka Group of Company | 12.03.2019 | විකාශන ආරම්භ කර නැත |

**පෘථිවි (Terrestrial) රූපවාහිනී විකාශන සඳහා බලපත්‍රලාභි ආයතන**

**අන්තර්ජාල මත පදනම් වූ රූපවාහිනී විකාශනයන්**

**(Internet Protocol Television ) බලපත්‍රලාභී ආයතන**

| No | බලපත්‍රලාභී ආයතනය | බලපත්‍ර ලැබූ දිනය |
|---|---|---|
| 1 | Sri Lanka Telecom Limited | 09.04.2007 |
| 2 | Dialog Television(Pvt)Ltd | 08.01.2012 |

**ජංගම දුරකථන මත පදනම් වූ රූපවාහිනි විකාශණය**

**(Mobile Television Broadcasting) සඳහා බලපත්‍රලාභි ආයතන**

| No | බලපත්‍රලාභී ආයතනය | බලපත්‍ර ලැබූ දිනය |
|---|---|---|
| 1 | Mobitel(Pvt)Ltd | 24.06.2008 |

**චන්ද්‍රිකා මත පදනම් වූ රූපවාහිනි විකාශණය ( Satellite TV ) සඳහා බලපත්‍රලාභි ආයතන**

| No | බලපත්‍රලාභී ආයතනය | බලපත්‍ර ලැබූ දිනය |
|---|---|---|
| 1 | Television and Radio Network | 30.05.1996 |
| 2 | The Southern Development Authority of Sri Lanka | 24.10.1996 |
| 3 | Messers Dynavision Broadcasting Co. (Pte)Ltd | 31.10.1997 |
| 4 | Voice of Asia Network( Pvt)Ltd | 14.05.2007 |
| 5 | The Buddhist Broadcasting Services (Guarantee) Ltd | 22.06.2007 |
| 6 | Dialog Television (Pvt)Ltd | 08.01.2012 |
| 7 | Ask Cable Vision Private Limited | 15.03.2012 |
| 8 | Dish Tv Lanka (Pvt) Ltd | 14.12.2014 |

**කේබල් මත පදනම් වූ රූපවාහිනි (Cable TV) විකාශනයන් සඳහා බලපත්‍රලාභි ආයතන**

| No | බලපත්‍රලාභී ආයතනය | බලපත්‍ර ලැබූ දිනය | |
|---|---|---|---|
| 1 | Television and Radio Network | 30.05.1996 | විකාශන ආරම්භකර නැත |
| 2 | Grant Commission (Pvt) Ltd | 15.07.1996 | විකාශන ආරම්භකර නැත |
| 3 | The Southern Development Authority of Sri Lanka | 24.10.1996 | විකාශන ආරම්භකර නැත |
| 4 | The Broad Band Network (Pvt) Ltd | 29.03.2007 | LBN |
| 5 | Voice of Asia Network (Pvt) Ltd | 14.05.2007 | විකාශන ආරම්භකර නැත |
| 6 | Lanka Cable & satellite Network (Pvt) Ltd | 24.01.2011 | |
| 7 | Dialog Television (Pvt) Ltd | 06.01.2012 | Dialog TV |
| 8 | Ask Cable Vision Private Limited | 15.03.2012 | |
| 9 | City Cable Link (Pvt) Ltd | 19.01.2009 | City Cable |
| 10 | Trymas Media Network | 12.03.2019 | විකාශන ආරම්භකර නැත |

මූලාශ්‍ර- තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ ජනමාධ්‍ය අමාත්‍යංශයෙන් ලබාගන්නා ලද විකාශන බලපත්‍ර පිටපත් ඇසුරෙන්

ඇමුණුම්-111

**විදුලි සංදේශ පනතේ 22 වගන්තිය යටතේ විදුලි සංදේශ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ගුවන් විදුලි තරංග බලපත්‍ර හිමි ආයතන**

**1. නිකුත්කර ඇති බලපත්‍ර වර්ග**

| No | බලපත්‍ර වර්ග | ප්‍රමාණය |
|---|---|---|
| 1 | FM විකාශන | 20 |
| 2 | කෙටි තරංග | 1 |
| 3 | මධ්‍යම තරංග | 1 |
| 4 | UHF සහ VHF / රූපවාහිනී විකාශන | 17 |
| 5 | චන්ද්‍රිකා මඟින් සෘජුව නිවෙස් වෙත විකාශන සේවාව<br>Direct-to-Home Satellite Broadcasting Service | 5 |
| 6 | කේබල් රූපවාහිනී පද්ධති<br>Cable TV Distribution Network | 3 |

**2. FM තරංග විකාශන බලපත්‍ර ලාභී ආයතන(ගුවන් විදුලි සේවා)**

| No | බලපත්‍රලාභී ආයතනය | විකාශන ස්ථාන ගණන |
|---|---|---|
| 1 | INDEPENDENT TELEVISION NETWORK | 14 |
| 2 | SRI LANKA BROADCASTING CORPORATION | 61 |
| 3 | SRI LANKA BROADCASTING CORPORATION | 6 |
| 4 | SRI LANKA BROADCASTING CORPORATION | 4 |
| 5 | COLOMBO COMMUNICATIONS LTD | 16 |
| 6 | MBC NETWORKS (PVT) LTD. | 41 |
| 7 | TELSHAN NETWORK (PVT0 LTD | 9 |
| 8 | TNL RADIO NETWORK (PVT) LTD | 14 |
| 9 | RURAS LANKA (PVT) LTD. | 5 |
| 10 | RANGIRI DAMBULLA DEVELOPMENT FOUNDATION | 4 |
| 11 | ASSET RADIO BROADCASTING (PVT) LTD | 10 |
| 12 | MGMR NETWORKS (PVT)LTD. | 2 |
| 13 | LANKA TELEVISION NETWORK (PVT) LTD | 4 |
| 14 | VOICE OF ASIA NETWORK (PVT) LTD. | 19 |
| 15 | PEOPLE'S MEDIA NETWORK (PVT) LTD | 6 |
| 16 | POWER HOUSE (PVT) LTD | 8 |
| 17 | LAKVIRU RADIO AND TELEVISION NETWORK (PVT) LTD | 2 |
| 18 | LAK VIEW BROADCASTING (PVT) LTD | 8 |
| 19 | THE FRIEND MEDIA NETWORKS (PVT) LTD | 1 |
| 20 | ASIA BROADCASTING CORPORATION (PVT) LTD. | 44 |

http://www.trc.gov.lk/2014-07-25-12-05-25/fm-sound-broadcasting.html

### 3. තරංග විකාශන බලපත්‍රලාභී ආයතන ^MF Broadcasters)

| බලපත්‍රලාභී ආයතනය | විකාශන ස්ථාන ගණන |
|---|---|
| SRI LANKA BROADCASTING CORPORATION | 4 |

http://www.trc.gov.lk/images/stories/spectrum/MF_14032017.pdf

### 4.මධ්‍යම තරංග (Medium Wave-1-HF Broadcasters)

| බලපත්‍රලාභී ආයතනය | විකාශන ස්ථාන ගණන |
|---|---|
| SRI LANKA BROADCASTING CORPORATION | 21 |

### 5.UHF සහ VHF/ රූපවාහිනී විකාශන බලපත්‍රලාභීන්ගේ ලැයිස්තුව

| No | බලපත්‍රලාභී ආයතනය | විකාශන ස්ථාන ගණන |
|---|---|---|
| 1 | TELESHAN NETWORKS (PVT) LTD | |
| 2 | SRI LANKA RUPAVAHINI CORPORATION | |
| 3 | INDEPENDENT TELEVISION NETWORK | |
| 4 | VOICE OF ASIA NETWORK (PVT) LTD | |
| 5 | ASIA BROADCASTING CORPORATION (PVT ) LTD. | |
| 6 | E A P BROADCASTING COMPANY LTD | |
| 7 | MTV CHANNEL (PVT) LTD | |
| 8 | VOICE OF ASIA NETWORK (PVT) LTD | |
| 9 | VIS BROADCASTING (PVT) LTD | |
| 10 | MGMR NETWORKS (PVT) LTD | |
| 11 | POWER HOUSE (PVT) LTD | |
| 12 | DIGITAL TERRESTRIAL TELEVISION | |
| 13 | IWS HOLDINGS (PVT) LTD | |
| 14 | PEOPLE'S MEDIA NETWORK (PVT) LTD | |
| 15 | SATIS AGENCY (PVT) LTD | |
| 15 | SHRADDHA MEDIA NETWORK | |
| 17 | RANGIRI DAMBULLA DEVELOPMENT FOUNDATION | |

http://www.trc.gov.lk/2014-07-25-12-05-25/uhf-vhf-tv-broadcasting.html

**6. චන්ද්‍රිකා මඟින් සෘජුව නිවෙස් වෙත විකාශණ සේවාව (Direct-to-Home Satellite Broadcasting Service) සඳහා බලපත්‍රලාභී ආයතන**

1. 1Dialog Television (Pvt.) Ltd
2. DISH TV Lanka (Pvt.) Ltd
3. MTV Channel (Pvt.) Ltd.,
4. SATIS Agency (Pvt.) Ltd.,
5. US Cable Services (Pvt.) Ltd.,

http://www.trc.gov.lk/images/pdf/statis_q42018.pdf

**7. කේබල් රූපවාහිනී පද්ධති (Cable TV Distribution Network) පවත්වාගෙන යාම සඳහා බලපත්‍රලාභි ආයතන**

1. Ask Cable Vision (Pvt.) Ltd
2. City Cables Links (Pvt.) Ltd.,
3. Trymas Media Network (Pvt.) Ltd.,

http://www.trc.gov.lk/images/pdf/statis_q42018.pdf

# 9. මූලාශ්‍ර


1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1966 අංක 37 දරණ ගුවන් විදුලි සංස්ථා පනත
3. 1974 අංක 5 දරණ ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත
4. 1977 අංක 11 දරණ ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත
5. 1988 අංක 48 දරණ ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත
6. 1996 අංක 8 දරණ ගුවන් විදුලි සංස්ථා (සංශෝධන) පනත
7. 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත
8. 1988 අංක 43 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත
9. 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත
10. 1996 අංක 27 දරණ දරණ විදුලි සංදේශ(සංශෝධන) පනත
11. 2005 ගුවන් විදුලි විකාශන පිළිබඳ උපදේශක කාරක සභා නියෝග
12. 2005 රූපවාහිනී විකාශන පිළිබඳ උපදේශක කාරක සභා නියෝග
13. 2007 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග
14. 2010 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග
15. 1996 අංක 2 දරණ විදුලි සංදේශ(ගුවන් විදුලි තරංග බලපත්‍ර)නියෝග
16. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබාදී ඇති බලපත්‍ර
17. ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති විකාශ බලපත්‍ර
18. රූපවාහිනී  සංස්ථා පනත යටතේ නිකුත් කර ඇති විකාශ බලපත්‍ර
19. ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව S. C. APPLICATION NO. 81/95.
20. අතකෝරල එදිරිව නීතිපති S.D. No.1/97-15/97
21. Centre for Policy Alternatives and Dr.PaikiasothySaravanamuttu vs. Anura PriyadarshanaYapa and Hon. Attorney General- SCFR No. 478/2008-
22. බෙනට් රත්නායක එදිරිව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 13-SLLR-SLLR-1999-V-2
23. https://sri-lanka.mom-rsf.org/si/%E0%B6%B8%E0%B6%B0%E0%B6%BA/detail/outlet/independent-television-network-itn/
24. ප්‍රවෘත්ති මාර්ග දර්ශක- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
25. වෙළඳ සේවයේ ව්‍යාපාර මෙහෙයුම් නීති රීති සංග්‍රහය- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව-1994
26. Code of Conduct- Sri Lanka Rupawahini Corporation

27. Code of Advertising  Stranded and Practices+ Copy Code - Sri Lanka Rupawahini Corporation
28. ගුවන් විදුලි වංශය- එම්. ඩී. කොළඹගේ
29. ජනසංනිවේදන ඉතිහාසය- රාජා කටුගම්පල
30. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තිය සහ නීතිය- Media reform Lanka
31. තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ ජනමාධ්‍ය අමාත්‍යංශයට යොමුකල තොරතුරු ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු
32. තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට යොමුකල තොරතුරු ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු
33. තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමුකල තොරතුරු ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු
34. තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත යොමුකල තොරතුරු ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු
35. තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත යොමුකල තොරතුරු ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු



MEDIA LAW FORUM


මාධ්‍ය නීති සංසදය
අංක 170, පළමු මහල, අලුත්කඩේ වීදිය, කොළඹ 12.
0743070888, 0779522887
prabodha@medialawforum.org
www.medialawforum.org